# The Buddhist

"ද බුඩිස්ට්"

Founded 1888

Vol : CXXXV - BE 2560 - No. 04, February 2017

ISSN-2012-6204



**The Colombo - Young Men's Buddhist Association**

**කොළඹ තරුණ බෞද්ධ සංගමය**

# Content - පටුන




| | Page |
|---|---|
| ඩී. බී. ජයතිලක ශ්‍රීමතාණෝ - සුනිල් එස්. සිරිසේන - ප්‍රධාන සංස්කාරක | 01 |
| අභිරූප නන්දා | 02 |
| “චේතනාහං භික්ඛවේ කම්මං වදාමි” | 03 |
| ආර්යන්ගේ පර්යේෂණ පිළිබඳ කියවෙන අරිය පර්යේෂණ සූත්‍රය | 05 |
| සිරි දළදා වහන්සේ ලක්දිව වැඩි වග | 08 |
| රාජ්‍ය යහපාලනයට බෞද්ධ උපදේශ | 10 |
| බුදු දහම හා සමාජ ස්ථරායන ගැටලුව | 13 |
| කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ප්‍රවෘත්ති | 18 |
| Sir D.B. JAYATILAKA | 19 |
| Anusaya Dhamma- Latent Disposition | 21 |
| First dependence of Paticca Samuppada - Avijja | 24 |
| Library in memory of Sir Baron | 26 |
| Events of the YMBA | 28 |
| SIR BARON JAYATILAKA OUTSTANDING BUDDHIST LEADER | 30 |
| Light Upon Light Energizing | 31 |
| YMBA News | 32 |


පිටකවරයේ
ඡායාරූපය :
කැලණිය
රජමහා විහාරය

**Cover :**
**Kalaniya Temple**


කංචුක නිර්මාණය :
කුසුමබන්දු සමරවික්‍රම
කොළඹ තරුණ බෞද්ධ සංගමයේ
උප සභාපති හා ද බුඩිස්ට්
සඟරාවේ සහකාර සංස්කාරක



**President -** Mr.Sumedha Amerasinghe
**Vice Presidents -** Mr. Rajah Kuruppu, Deshabandhu Tilak de Zoysa, Mr. M. Ariyaratne, Mr. Kusumabandu Samarawickrama , Mr. Mahesh Mallawaratchie
**Hony. Gen.Secretary -** Mr. Mahendra Jayasekera
**Hony.Treasurer -** Mr. Prasantha Abeykoon



**Address -** Colombo YMBA, No 70 , D.S. Senanayake Mawatha, Colombo 8, Srilanka.

**Phone** +9411-2695598 +9411-2682397 +9411-2695786 +9411-2682398 +9411-2698083
**Fax** +9411-2682397
**Web site** www.ymba-colombo.org
**Email** ymbacolombo@sltnet.lk
**Facebook** www.facebook.com.ymba.org



**Design & Layout by** ANCL Publication Dept.
**Printed by** ANCL, No.35, Lakehouse, Colombo 10.

"ද බුඩිස්ට්"

The Buddhist

ආරම්භය 1888

ප්‍රධාන සංස්කාරක - සුනිල් එස්. සිරිසේන
සංස්කාරක (සිංහල) - පියදස වත්තේගම
සහකාර සංස්කාරක - කුසුමබන්දු සමරවික්‍රම

කලාපය - CXXXV | බුද්ධ වර්ෂ 2560 | අංක - 04 | ක්‍රි.ව - 2017 | පෙබරවාරි

## කතුවැකිය

# ඩී. බී. ජයතිලක ශ්‍රීමතාණෝ

මෙවර කතුවැකිය ලියැවෙන්නේ සුවිශේෂී පුද්ගලයකු පිළිබඳව බැවින් 1927 පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමයේ සංවත්සර රැස්වීමේ මූලාසනයේ සිටිමින් එතුමා පැවසූ අදහසක් මුලින් උපුටා දැක්වීම උචිත යැයි සිතමි.

"මේ රටේ දරුණු අපරාධ දිනෙන් දින වැඩිවන බව පෙනේ. සියලු සතුන්ට මෛත්‍රිය පැතිරවීමට දේශනා කළ රටක මෙතරම් අපරාධ වැඩි වන්නේ කුමක් නිසා ද යන්න තමුන්නාන්සේලා කල්පනා කළ යුතුය. අපරාධ අඩු කරන්නට නම් අප හික්මෙන අතර අසල්වැසියන් හික්මවීමට කටයුතු කළ යුතුය. එය කළ හැක්කේ කුඩා කල සිටම ධර්මය ඉගැන්වීමෙනි. කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් දහම් පාසැල් ආරම්භ කරන ලද්දේ මේ නිසා ය. ළමයින්ට ධර්මදානය ලබා දීම සෑම බෞද්ධයෙකුගේ ම යුතුකමක් වන්නේ ය."

මෙම ප්‍රකාශය විද්වත් බහුපඨිත දේශකයකු වූ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමා විසින් 1927 තරම් ඈත කාලයක ප්‍රකාශ කරන ලද්දේ වුව ද, අද ශ්‍රී ලාංකික සමාජයට ද මෙය එකසේ වැදගත් වේ. මන්දයත් අද මෙරට සමාජය වඩාත් අගතිගාමී ප්‍රවාහයකට ගොදුරු වී සිටින බැවිනි. ඩී. බී. ජයතිලක ශ්‍රීමතාණන්ගේ 150 වැනි ජන්ම සංවත්සරය සමරන මොහොතේ එතුමා කළ කී දේ පිළිබඳ යථාවබෝධයෙන් සොයා බැලීම මෙරට බෞද්ධයාගේ හිත සුව පිණිස වනු ඇත. මන්දයත් ධර්මය ඉගැන්වීම, දහම් පාසල් ක්‍රමය, බෞද්ධයන්ගේ යුතුකම් සියල්ල අද කිසියම් උකටලී ස්වභාවයකට පත් ව ඇති බැවිනි.

1868 පෙබරවාරි 13 දා උපත ලද එතුමාගේ රට, දැය, සමය පිළිබඳ අවබෝධය පුළුල් වූයේ කුඩා කාලයේ ම පැලියගොඩ විද්‍යාලංකාර ශාස්ත්‍රාලයේ, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක ස්වාමීන් වහන්සේ ආභාෂයෙන් බව සඳහන් කළ යුතුය. වරාගොඩ බැප්ටිස්ට් විද්‍යාලයෙන් සහ පිටකොටුවේ වෙස්ලි විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලද නමුත් එතුමා හොඳ සිංහල බෞද්ධ පදනමක් සකසා ගත්තේ ශ්‍රී ධර්මාලෝක ස්වාමීන්වහන්සේ ඇසුරෙනි.

එතුමාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍ය ලෙස අප දකින්නේ ඉඩම් දෙපාර්තමේන්තුවේ ලිපිකරු තනතුරට ඉදිරිපත් වීමේ දී එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි බුද්ධිමතුන් විසින් එතුමාගේ හැකියාවන් අවබෝධ කරගෙන තවදුරටත් අධ්‍යාපන කටයුතු කරන මෙන් එතුමා දිරිමත් කිරීම යි.

ඒ වන විට කේම්බ්‍රිජ් සීනියර් විභාගයෙන් සමත් ව සිටි ජයතිලක මැතිතුමා පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ එකඟත්වයෙන් මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති තනතුරට පත් කෙරිණි. 1890 දී ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති තනතුරට පත්වන විට ඔහුගේ වයස අවු. 22ක් විය. බෞද්ධ අධ්‍යාපනය ගැනත්, බෞද්ධ ජනතාව මුහුණ පා තිබූ ගැටලු ගැනත් ඉංග්‍රීසි පාලකයන්ගේ අත්තනෝමතික පාලන ක්‍රමය පිළිබඳවත් එතුමා නිවැරදි අවබෝධයකින් කටයුතු ආරම්භ කළේ මේ කාලයේ දී බව අපගේ විශ්වාසය යි. තවදුරටත් අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කර ගැනීම තම කටයුතුවලට වඩාත් වැදගත් වන බව තේරුම්ගත් එතුමා කල්කටා විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රපති උපාධිවලින් සමත් වූයේ ය. අධ්‍යාපනය සහ අනාගතය පිළිබඳ තරුණ පරපුරට දුන් එතුමාගේ පණිවුඩය ඉතා වැදගත් ය. එක්තරා දේශනයක දී ඔහු මෙසේ සඳහන් කළේ තරුණයන් පිළිබඳවයි.

"මගේ ඒකායන අපේක්ෂාව මව්බිමට සේවය කිරීමටයි. තරුණයෝ යනු අනාගත නායකයෝ ය. ඔවුන්ගේ සිත බියෙන් තොරය. කරදර හිරිහැරවලට ඔවුහු බිය නොවෙත්. තරුණකම මගේ දියුණුවේ රහසයි".

මහනුවර ධර්මරාජය, ජයතිලක මැතිතුමාගේ පරිපාලනය යටතේ කැපී පෙනුණ දියුණුවක් ලැබීය. එහි ප්‍රතිඵලය වූයේ 1898 වසරේ කොළඹ ආනන්ද විදුහලේ උප විදුහල්පති තනතුරට එතුමා පත්කිරීමට පරම විඥනාර්ථ බෞද්ධ සමාගම කටයුතු කිරීමයි.

1900 ආනන්ද විදුහලේ විදුහල්පති තනතුරට පත් එතුමා අතිදක්ෂ විදුහල්පතිවරයකු වූවා පමණක් නොව ආනන්දය නිසි පර්යාලෝකයේ පිහිටුවීමේ සමත් ප්‍රඥාවෙන්ද යුක්ත වූයේය.

මෙහි ප්‍රතිඵලය වූයේ එවකට අධ්‍යාපනයේ පූර්ණ ආධිපත්‍යය හිමිකරගෙන සිටි මිෂනාරී පාසැල් අභිබවා ආනන්ද විදුහල විශිෂ්ට ප්‍රතිඵල සහිත බෞද්ධ පාසලක් බවට පත්වීමයි. පසු කලෙක ආනන්දයේ විදුහල්පති පදවිය දැරූ ජී. ද ඇස්. කුලරත්න මැතිතුමා විසින් ඒ පිළිබඳ මෙසේ සටහන් කර ඇත.

"සුද්දන් විසින් පාලනය කරන ලද මිෂනාරී පාසල්වලින් ලැබූ අධ්‍යාපනයට නොදෙවෙනි විශිෂ්ට අධ්‍යාපනයක් ලාංකිකයන් පාලනය කරන බෞද්ධ පාසැල්වලින් ද ලබාදිය හැකි බව සනාථ කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයා ඩී. බී. ජයතිලක මැතිතුමා ය".

ජයතිලක මැතිතුමා ආනන්දයට කළ මෙහෙවර, මෙරට බෞද්ධ පාසල් බිහිකිරීමේ පුරෝගාමී කටයුත්තක නියැලි ව සිටි පරම විඥනාර්ථ බෞද්ධ සමාගමට තම කාර්යභාරය වඩාත් ශක්තිමත් ව ඉටු කිරීමට විශාල අනුබලයක් සැපයී ය.

මව්බස සුභාවිත කිරීමේ අභිලාෂයෙන් සිංහල ශබ්දකෝෂයේ කාර්යභාරය ද එතුමා ඉත සිතින් භාර ගත්තේ ය. දම්පියා අටුවා ගැටපදය, සද්ධර්ම රත්නාවලිය, සිකවළඳ විණිස වැනි ග්‍රන්ථ සංශෝධනය කොට මුද්‍රණය කිරීමේ කාර්යය ද ඔහු විසින් ඉටුකරන ලදී. එතුමා එංගලන්තයේ අධ්‍යාපනය ලැබූ අවදියේ දී මෙරට දේශමාමකයන් විසින් ආරම්භ කරන ලද අමද්‍යප ව්‍යාපාරයේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කළේය.

1944 මැයි 29 දින අභාවප්‍රාප්ත වන විට එතුමා 1898 සිට වසර 46ක් නොකඩවා කොළඹ තරුණ බෞද්ධ සංගමයේ සභාපති ධූරය දැරීය. එතුමාගෙන් කොළඹ තරුණ බෞද්ධ සංගමයට සිදු වූ සේවය අති මහත්ය. බුද්ධිමතකු, දේශපාලනඥයකු, නිර්භීත චින්තකයකු වූ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමාගේ සේවය නිරන්තරයෙන් සිහිපත් කිරීම දේශමාමක බෞද්ධයන්ගේ යුතුකමකි.

එතුමාගේ ජීවිතය සුවිශේෂිත ය. එතුමා අපරිමිත ධෛර්යයක් සහ නිවැරදි චින්තනයක් තිබූ බුද්ධිමතෙකි. රට දැය සමය පිළිබඳ නිරවද්‍ය දර්ශනයකින් කටයුතු කළ උතුම් මිනිසෙකි. උපන් දේශයට ණය නැති ශ්‍රේෂ්ඨයෙකි.

ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමාගේ චරිතාපදානය මෙරට සෑම බෞද්ධ දරුවෙකුම පරිශීලනය කළ යුතු ග්‍රන්ථයක් බවට පත් කිරීම මෙරට බෞද්ධයන්ට කෙරෙන මහඟු සේවයක් වනු ඇත. ජයතිලක ශ්‍රීමතාණන්ගේ 150 වැනි සංවත්සරය වෙනුවෙන් එතුමාගේ උදාර ජාතික මෙහෙවර හැකිතාක් ප්‍රචලිත කිරීමට අදිටන් කර ගනිමු.

සුනිල් එස්. සිරිසේන
ප්‍රධාන සංස්කාරක

# අභිරූප නන්දා

වන පස කුසුම් මඳ සුළිඟින් රඟනු වැනී
ළා හිරු කිරණ මිහිළිය ළැම වැළඳ ගනී
පුරයෙහි ගෙදිඟු විල් පියුමෙහි සුවඳ දනී
නගරය "කපිලවත්" අලකාපුරය මෙනී

චන්දන අගිල් සුනු සුදු, මුදු ගතෙහි උලා
පුන් සඳ පරිදි හිනැහෙන හැර අඳුර පලා
රොන්බර මලක් මෙන් පැතිරුණ සුවඳ ගලා
"නන්දා" කපිලවත් පුරයම එකළු කළා

දඹදිව් තලයෙ රසකාමින් නයන හෙලූ
ඇගෙ කේ කලප දණහිස් යුග සිපින වලූ
"නන්දා" රූබරිය ලස්සන නයන කලූ
සුරඹුන් පවා ඕ අබිමුව වුනහ ගොලූ

දැළි රොද පවා නැතිමුත් මුදු වතෙහි පිපී
බඹරෙකු විලස හැසිරෙන වනමලක හැපී
"කෙලෙසද? සමාජෙට දෙන්නේ මුහුණ අපී"
කියමින් නයෙකුමෙන් ඇත මහ නිරිඳු කිපී

පෙම්දම පවත්වා දෙමහල්ලනට හොරෙන්
හැංගී ගයන විට පෙම් ගී මිහිරි සරෙන්
මේ ගැන උරණ වී හැකිලුණ මුහුණු වරෙන්
"රෝබා" නදිය ගැලුවේ අද කඳුළු බරෙන්

කිමිදී ගිලී සදහම් රස කළිඳු ගඟේ
පුහුදුන් පිරිස යොමුකොට අට අරිය මගේ
දෙව්රම් වෙහෙර වැඩසිටි සිහරදකු වගේ
සැලවුණි මේ පුවත සම්බුදු හිමිට මගේ

ගෙන්වා නන්ද කුමරුන් එහි පැසුළු දොරෙන්
මුදවා ගනු පිණිස ඔහු රැඳි අඳුරු තිරෙන්
දම්රස බෙදා දී ඔහු හට මිහිරි සරෙන්
පැළඳුවෙ කසාවත "නන්දාවනට" හොරෙන්

ඕජස් ගලායන නව දොරකින් බේරී
කුමටද? වසඟ වී මේ රුවකට නාරී
ඒ අමදහම් කුමරුන් නන්දට තේරී
පිරිවැජි බිමට පිවිසුණි අරගෙන වීරී

(ගාල්ලේ පියදස් කල්පගේ)



# "චේතනාහං භික්ඛවේ කම්මං වදමි"

ලයනල් රණසිංහ

බුදුපියාණන් වහන්සේ පහළ වන අවදියේ භාරතයේ පැවතියේ සාස්වතවාදය (ආත්මවාදය), උච්ඡේදවාදය (අනාත්මවාදය) වැනි දර්ශන මත පදනම් වූ ආගම්ය. බුදුන් වහන්සේ මෙම මතවාද ප්‍රතික්ෂේප කළහ. ආත්මයක් නැතත් සසර ගමනක් සිදුවන බව පළිගත්හ. ආත්මයක් නොමැති නම් සසර ගමනක් සිදුවන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමේ අභියෝගයට උන්වහන්සේ මුහුණ දුන්හ. මෙම කරුණ විස්තර කිරීමට බුදුපියාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය, හේතුඵල වාදය, ත්‍රිලක්ෂණය වැනි ධර්මතා උපයෝගී කර ගත්හ. චතුරාර්ය සත්‍යයෙන් කියවෙන්නේත් ත්‍රිවිධ තන්හාව හේතුකොටගෙන සසර ගමන සකස් වන බවය. මෙ කරුණ හේතුඵල ධර්මයෙන් (පටිච්ච සමුපාදයෙන්) තවතුරටත් විස්තර කළහ. මෙලෙස හේතු නිසා හට ගන්නා සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යය, දුක්ඛ, අනාත්ම බව ත්‍රිලක්ෂණ ධර්මයෙන් විස්තර කරයි.

මෙම ධර්මතා පදනම් කරගෙන ආත්මයක් නොමැතිව හේතුඵලවාදීව පහළ වන චිත්ත චෛතසික ධර්මතා පරම්පරාව නිසා සසර ගමන සිදුවන බව දේශනා කළහ. මෙම ක්‍රියාදමයේදී චුති සිතට අනුව හට ගන්නා ප්‍රතිසන්ධි සිත චුති සිතම නොවේ යැයි ද, වෙනත් ම සිතකුත් නොවේ යැයි ද, චුති සිත හේතු වී ඵලය ලෙස හටගත් සිතක් යැයි ද, විස්තර කළහ. මෙම කාර්යයේදී කර්මය ප්‍රමුඛ වන අතර කර්මය යනු "චේතනාහං භික්ඛවේ කම්මං වදමි, චේතඉත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා" යනුවෙන් චුල්ලකම්ම විභංග සූත්‍රයේ දේශනා කරන ලදී. මහණෙනි, කර්මය යනු චේතනාවයි. සිතින් සිතා කයෙන් වචනයෙන්, මනසින් කර්ම සිදුවේ යැයි යනු මෙහි අදහසයි.

බුදු දහමේ කර්මය යනු චේතනාවයි යන්න මෙයින් තහවුරු වී ඇත. අද බෞද්ධ අබෞද්ධ බොහෝ දෙනා අතර මෙම "චේතනාව" යන වචනය ව්‍යවහාර වේ. ඒ හොඳ චේතනා, නරක චේතනා, පිරිසිදු චේතනා ආදී වශයෙනි. අප රටේ අධිකරණයේ දී ද මනුෂ්‍ය ඝාතනයක් වැනි කරුණක දී එය මරණ චේතනාවෙන් සිදු නොකළේ යැයි සමහර නීතිඥ මහතුන් තර්ක කරන අවස්ථා දක ඇත. එම තර්කය මත චූදිතයන්ට දඬුවම් ලිහිල් වූ අවස්ථා ද දක්නට ඇත. සාමාන්‍ය ව්‍යවහාරයේ දී සිතිවිල්ලට චේතනාව යැයි සඳහන් කරන බවත් අද දක්නට ලැබේ. කෙසේ හෝ චේතනාව පිළිබඳ බුදු පියාණන් වහන්සේගේ දේශනා ආශ්‍රයෙන් තොරතුරු දූන ගැනීම උචිත යැයි සිතමි.

මෙය ඉතා පැහැදිලිව වටහා ගත හැක්කේ බුදුපියාණන් වහන්සේ දේශනා කරන ලද පරමාර්ථ ධර්මයේ ආශ්‍රයෙනි. ඒ අනුව ලොව පවත්නා සියලු දේ චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යනුවෙන් උන්වහන්සේ කොටස් හතරකට බෙද විස්තර කළහ.

අප සාකච්ඡා කරන චේතනා ගැන වටහා ගැනීමට මෙයින් චිත්ත චෛතසික යන පරමාර්ථ ධර්ම දෙක ගැන විමසා බැලිය යුතුය. ඒ අනුව කුසල් සිත්, අකුසල් සිත්, කුසල් හෝ අකුසල් නොව (කිරිය සිත්) යනුවෙන් සිත් 89 ක් ගැන සඳහන් කර ඇත. එමෙන්ම අන්‍ය සමාන (සබ්බ චිත්ත සාධාරණ හා පකින්තක) අකුසල හා කුසල යනුවෙන් චෛතසික ධර්මයෝ 52 ක් ද වෙති. මේවා සිත සමඟම ඉපදී, සිත සමඟම පැවතී, සිත ගතක් අරමුණම ගෙන, සිත සමඟම නැතිවය යයි. අකුසල් සිතක හා කුසල් සිතක මෙම චෛතසික යෙදෙන ආකාරය විමසා බලමු.

» පළමු ලෝභ අකුසල් සිත වන්නේ "සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුක්ත අසංකාරික සිත" (සාමාන්‍යයෙන් සොරකු සොරකම් කරන අවස්ථාවක මේ සිත පහළ විය හැකිය.) මේ අකුසල් සිත සමඟම පෙර සඳහන් කළ විදිහට උපදින චෛතසික මෙසේය.

01.සබ්බ චිත්ත සාධාරණ චෛතසික07 (ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකාග්ගතා, ජීවිතේන්ද්‍රිය, මනිසකාර)
02.ප්‍රකීර්ණක චෛතසික 06 (විතක්ක, විචාර, අධිමෝක්ඛ, වීරිය, පීති, ඡන්ද)
03.අකුසල චෛතසික 06 (මෝහ, අහිරික, අනොත්තප්ප, උද්දච්ඡ, ලෝභ, දිට්ඨි)

මේ අනුව සබ්බචිත්ත සාධාරණ චෛතසික 07, ප්‍රකීර්ණක චෛතසික 06, අකුසල චෛතසික 06 සියල්ලම 19 කි.

» පළමු වන කුසල සිත ලෙස සඳහන් වනනේ සෝමනස්ස සහගත, පදනසම්පයුක්ත, අසංකාරික සිත (උපාසක මහතෙකු විහාරස්ථානයට ගොස් තෙරුවන් වැඳීම විය හැකිය.) මේ කුසල් සිතෙහි පහළ වන චෛතසික මෙසේය. (01) සබ්බ චිත්ත සාධාරණ තෛසික 07 (පස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකාග්ගතා, ජීවිතේන්ද්‍රිය, මනිසකාර)
(02)ප්‍රකීර්ණක චෛතසික 06 (විතක්ඛ, විචාර, අධිමෝක්ඛ, විරිය, පීති, ඡන්ද)
(03)කුසල චෛතසික
(i) සෝභන සාධාරණ චෛතසික 19 (සද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලෝභ අදෝශ, තත්‍ත්‍රමජ්ජතා, කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, කායලහුතා, චිත්තලහුතා, කායමුදුතා, චිත්ත මුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්ඤ්ඤතා, කායාපාගුච්චතා, චිත්තපාගුච්චතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා)
(ii) විරති චෛතසික 03 (සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව)
(iii)අප්පමඤ්ඤතා චෛතසික 02 (කරුණා, මුදිතා)
(iv) ප්‍රඥ චෛතසික 01 (ප්‍රඥ)

මේ අනුව මෙම කුසල සිත සමඟ චෛතසික 38 ක් පහළ වේ. මෙම තොරතුරු අනුව අපගේ විමසුමට ලක්වන වැදගත් කරුණු,

01. චේතනාව යනු කුසල හෝ අකුසල සිතක් නොව සිත් සමඟ යෙදෙන සබ්බචිත්ත සාධාරණ නම් වූ චෛතසිකයකි.

02. කුසල් පක්ෂයේත් අකුසල පක්ෂයේත් සබ්බ චිත්ත සාධාරණ චෛතසික ව චේතනා නම් චෛතසිකය යෙදී ඇත. සෑම චෛතසිකයකටම කාර්යභාරයක් ඇත. උද : සද්ධා චෛතසිකය කුසල සිතක් අනෙක් චෛතසික 37 ත් ශ්‍රද්ධාවට පත් කරයි. එමෙන් චේතනා චෛතසිකයේ කාර්යභාරය ද ඉතා වැදගත් එකකි. පහළ වන සිතක් අදළ චෛතසිකත් අරමුණ කරා මෙහෙය වන්නේ චේතනා චෛතසිකයයි. හරියට පන්ති නායකයෙකු පන්තියේ ළමයින් හසුරුවන්නා වගේ යැයි දහම් පොතපතෙහි සඳහන් වේ. මේ තොරතුරු අනුව අකුසල පක්ෂයේ පහළ වන චේතනා චෛතසිකය අකුසල චෛතසිකයකි. කුසල පක්ෂයේ පහළ චේතනා චෛතසිකය කුසල චෛතසිකයකි. එනිසා අකුසල චේතනා චෛතසිකයක් මෙහෙය වන්නෙ අකුසල කර්මයකි. කුසල චේතනා චෛතසිකයක් මෙහෙය වන්නේ කුසල කර්මයකි.

03.අකුසල චෛතසික අප තුළ නිතර පවතින ධර්මතාවයන් ය. උද : මෝහය, අවිද්‍යාව, වැරදි කිරීමට ලැජ්ජා භය නැතිකම සිතේ විසිරී යාම ලෝභය ආදී ද, නමුත් කුසල චෛතසික අප තුළ ආයාසයෙන් ඇති කර ගැනීමට වැඩිය යුතු ධර්මයෝය. උද : ශ්‍රද්ධා, සති, ලැජ්ජා, භය, අදෝෂ, අමෝහ ආදී වේ. මේ නිසා අකුසල සිත් නිරායාසයෙන් පහළ වන අතර කුසල සිත් ආයාසයෙන් පහළ කරගත යුතුය.

04.සංඛ්‍යාත්මකව බැලුවත් අප උදහරණයට ගත් ලෝභ සිත සමඟ පහළ වන්නේ චෛතසික ධර්ම 19 කි. නමුත් කුසල සිත ක්‍රියාත්මක වීමට චෛතසික ධර්ම 38 ක් වැඩිය යුතුය. ඒ අනුව අකුසල් පහසුවෙන් සිදුවන අතර කුසල් සිදු කර ගත හැක්කේ අපහසුවෙනි. අවසානයේ සඳහන් කළ හැක්කේ චේතනාව යනු සිත හා චෛතසික මෙහෙය වන සබ්බචිත්ත සාධාරණ චෛතසිකයකි. අප චේතනාන්විතව යමක් කරන විට චේතනා චෛතසිකය පූර්වාංගම වේ. ඇවිද යන විට කුහුඹුවකු නොදැනුවත්ව පෑගී මරණයට පත්වීමේදී එම සතාගේ මරණය චේතනාව මෙහෙයවා කළ දෙකක් නොවන නිසා එය අකුසල කර්මයක් බවට පත් නොවේ. මේ නිසා බුදුරජාණන් වහන්සේ "චේතනාංහ භික්ඛවේ කම්මං වදමි" යනුවෙන් දේශනා කළ සේක.

*ලයනල් රණසිංහ,*
*දහම් පාඨශාලාචාර්ය,*
*90ඒ/54, පහළ කරගහමුණ, රාගම පාර, කඩවත.*
*දු.අංකය : 077-6048205.*

**බුදු දහමේ කර්මය යනු චේතනාවයි. යන්න මෙයින් තහවුරු වී ඇත. අද බෞද්ධ අබෞද්ධ බොහෝ දෙනා අතර මෙම "චේතනාව" යන වචනය ව්‍යවහාර වේ. හොද චේතනා, නරක චේතනා, පිරිසිදු චේතනා ආදී වශයෙනි. අප රටේ අධිකරණයේ දී ද මනුෂ්‍ය ඝාතනයක් වැනි කරුණක දී එය මරණ චේතනාවන් සිදු නොකළේ යැයි සමහර නීතිඥ මහතුන් තර්ක කරන අවස්ථා දැක ඇත. එම තර්කය මත චූදිතයන්ට දඬුවම් ලිහිල් වූ අවස්ථා ද දක්නට ඇත.**





# ආර්යයන්ගේ පර්යේෂණ පිළිබඳ කියවෙන අරිය පර්යේෂණ සූත්‍රය

**කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවනේ ආචාර්ය ගලගෙදර රතන වංස හිමි**

සූත්‍ර පිටකයට අයත් පොත් පහෙන් මජ්ජිම නිකායට අයත් වන සුවිශේෂිතම සූත්‍රයක් ලෙස අරිය පරියේණ සූත්‍රය හැඳින්විය හැකිය. එම සූත්‍රය එතරම් වැදගත් වන්නේ කරුණු කිහිපයක් හේතු කොට ගෙනය. ඓතිහාසික වශයෙන් කරුණු එකතුවක් හැටියට ගොනු කොට දේශනා කර තිබීමත් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද නෛර්යානික ප්‍රතිපදාව විවරණය කර තිබීමත් මෙම සූත්‍රයේ ඇති සුවිශේෂත්වයයි.

අරිය පරියේෂණ යනුවෙන් හැඳින්වෙන්නේ නැතිනම් අදහස් කරන්නේ ආර්යයන්ගේ පර්යේෂණ ක්‍රමයි. එසේම මෙම සූත්‍රය දේශනා කිරීමට ඓතිහාසික පසුබිමක් තිබීමද මෙම සූත්‍රය හැදෑරීමේදී වැදගත් වන සාධකයකි. එදා බුදුන් ලොව පහළ වන යුගය වන විට අනාර්ය පර්යේෂණ ක්‍රම පිළිබඳ අවධානයක් යොමු කොට මෙම සූත්‍රය දේශනා කරන්නට ඇති බව විශ්වාස කළ හැකිය. එවකට තිබුණු නොයෙක් ආගමික සංස්ථාවලින් කී කරුණු බොහෝ දුරට සත්‍ය ප්‍රකාශන නොවේ. දෙසැටක් මිත්‍යා දෘෂ්ඨී පැවැති මෙම වකවානුව තුළ මෙවැනි සූත්‍රයක ඇති සුවිශේෂිතාවය මනාව පිළිඹිබු වේ.

අරිය හෙවත් ආර්ය යන වචනය උතුම්, ශ්‍රේෂ්ඨ හා නිවැරදි යන අර්ථ ගන්වන බව ධර්මානුකූල විවරණයක යෙදීමේදී පැහැදිලි වේ. විශේෂයෙන් බුදු, පසේ බුදු, මහඅරහත් යන නික්ලේසී උත්තමයන් වහන්සේලා උදෙසා එම වචනය භාවිත කරනු ඇත. එසේ වුවද එදා භාරතය තුළ නොයෙක් ශාස්තෘවරුන් තමන් රහත් යැයි සිතා ක්‍රියාකර ඇත. ශාස්වත හා උච්ඡෙද යන අන්තද්වයට වැටී ක්‍රියා කළ එවැනි ආගමික නායකයින් හා අනුගාමිකයින් එම වචනය අයුතු ලෙස භාවිත කරන්නට ඇත. එබැවින් එහි නියම අර්ථය දත් බුදුරජාණන් වහන්සේ එම වචනයේ අර්ථයට ගැලපෙන අයුරින් එය භාවිත කරන අයුරු මෙම සූත්‍රය තුළින් පහදා දී ඇත.

අටුවා ග්‍රන්ථවල ආර්ය යන නමින් සෝවාන් මාර්ගයේ සිට අරහත් මාර්ගය දක්වා වූ විශිෂ්ට මාර්ගයකට පිළිපන් සප්ත ශෛක්ෂයන් අදහස් කරන බව දක්වා ඇත.

ඒ තුළින් පැහැදිලි වන්නේ අනාර්ය වූ ප්‍රදේශ විශේෂයක්ද දක්නට ලැබෙන බවයි. අනාර්ය යන වචනය මානව වර්ගයාත් සමඟ ඇති වන කුල ගෝත්‍ර හා සබැඳි පුද්ගල විශේෂයක් ගැන නොකියෙවන අතර, කෙලෙස් සහිත පුහුදුන් පෘතග්ජන පුද්ගලයන් එම වචනයෙන් හැඳින්වීම වඩාත් නිවැරදිය. අනාර්ය පුද්ගලයන්ගේ පර්යේෂණ ආර්ය පුද්ගලයන්ට වඩා හාත්පසින්ම වෙනස්ය. ආර්යයන් උතුම් තත්ත්වය පර්යේෂණ කරන අතර අනාර්යයන්ගේ පහත් තත්ත්වය පර්යේෂණ කරනු ඇත. අනාර්යයන් රාගය, ද්වේශය, මෝහය පිරිපුන් සිතුවිලි දහරාවකින් එම පර්යේෂණය කරනු ඇත. විශේෂයෙන් කාමයෙන් අන්තයට ගොස් කාම ගින්නෙන් පිළිස්සී ජීවත් වනු ඇත. එහි නිමාවක් ද නොපෙනේ. අනාර්යයන්ගේ පර්යේෂණ ලෞකිකය. ආර්යයන්ගේ පර්යේෂණ ලෝකෝත්තරය.

අනාර්යයන් උත්සාහ කරන්නේ ලෞකික සැප සම්පත් තුළින් සැනසීමටය. එහිදී යථාර්ථය නැත්නම් සත්‍ය දැකීම මිත්‍යාවකි. උදාහරණයක් වශයෙන් එදිනෙද ජීවිතයට ඇලුම් කිරීම හා ඒවා උපාදානයෙන් අල්ලා ගැනීම පෙන්වාදිය හැකිය. දුවාදරුවෝ, හරකා බාන, වතු පිටි, ඉඩ කඩම්, යාන වාහන, ගේ දෙර ආදී භෞතික සම්පත් මතම ගැටී, ඇලී, ගැලී ජීවත් වීම ඔවුන්ගේ ස්වභාවයයි. එහිදී වන්නේ සංසාරික පැවැත්ම දිගුවීමක් හැර කෙටි වීමක් නොවේ. කුඩැල්ලා එක පැත්තක් අත් හරින්නේ අනිත් පැත්තෙන් අල්ලාගෙනය. එසේම එවැනි සත්ත්වයා ද සසර අල්ලා ගනිමින් භවයේ සැරිසරයි. ඒ නිසා තණ්හා, මාන, අනුසය දුරු කළ යුතු බව මතක් කළ යුතුය.

පාලි සූත්‍රවල පර්යේෂණ යන වචනය දක්වා ඇත්තේ පරියේසනා යනුවෙනි. ත්‍රිපිටක සූත්‍රවල ඒ සනා, ගවේෂණ, පර්යේෂණා යන වචන තුන අනුපිළිවෙළින් යොදා ඇති අයුරු දක්නට ලැබේ. ඒ සනා යනුවෙන් දැක්වෙන්නේ සෙවීමයි. ගවේෂණා යනුවෙන් දක්වා ඇත්තේ උතුම් සෙවීමයි. එහිදී ගො ය එසනා (ගවයන් සේවීම) යන විසන්ධිය තුළ දක්නට ලැබෙන ගෝ ශබ්දය උතුම් යන අර්ථයෙහි ද ගව යන අර්ථයෙහි ද යෙදෙන බව තේරුම් ගත යුතුය. ඒ දෙකටම වඩා ගැඹුරින් දේශනා කරන්නේ පරියේෂණ යන වචනයයි. ඉහත දැක්වූ වචන දෙකටම වඩා මෙහිදී විධිමත්ව එකින් එක විමර්ශනයකට ලක්වන අයුරු කියවේ. එය ප්‍රඥාව උසස්ම අයුරින් යොදා කරන විශ්ලේෂණයකි. මෙහිදී අපට ගත හැකි වචනයක් වශයෙන් “විභජ්ජවාදී” යන වචනය වැදගත් වේ. එහිදී එකින් එක කරුණු පරීක්ෂණයක් විශ්ලේෂණයක් පිළිබඳ කියවේ. සමහර පිරිස් මෙම වචනය වැරදි ලෙස ද යොදා ගන්නා අයුරු දක්නට ලැබේ. එය ධර්මානුකූල පිළිගැනීමක් වශයෙන් සලකන්නට නොපුළුවන.

බුදු දහමට අනුව කරුණු පැහැදිලි කිරීමේදී උච්ඡේද වාදයට හා ශාස්වත වාදයට එනම් ඇත නැත යන අන්තද්වයට නොවැටී මධ්‍යම ප්‍රතිපදාවේ සිට කරුණු විග්‍රහ කර තිබීම ඉතා වැදගත් වේ. එබැවින් බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය කිසිදු අන්තයකට නොවැටේ. ඒ නිසාම එහි ඇති වටිනාකම ද මොහොතක් ගානේ ඉහළ යනු ඇත. සමහර ආගම් හා දර්ශන ආපස්සට යන්නේ මධ්‍යම ප්‍රතිපදාවක් දක්නට නොමැති බැවිනි. බුදු දහම අකාලික වූ පර්යේෂණ ක්‍රමයක් බව මනාව පැහැදිලි වේ.

**පාලි සූත්‍රවල පර්යේෂණ යන වචනය දක්වා ඇත්තේ පරියේසනා යනුවෙනි. ත්‍රිපිටක සූත්‍රවල ඒ සනා, ගවේෂණ, පර්යේෂණා යන වචන තුන අනුපිළිවෙළින් යොදා ඇති අයුරු දක්නට ලැබේ. ඒ සනා යනුවෙන් දැක්වෙන්නේ සෙවීමයි. ගවේෂණා යනුවෙන් දක්වා ඇත්තේ උතුම් සෙවීමයි. එහිදී ගො ය එසනා (ගවයන් සේවීම) යන විසන්ධිය තුළ දක්නට ලැබෙන ගෝ ශබ්දය උතුම් යන අර්ථයෙහි ද ගව යන අර්ථයෙහි ද යෙදෙන බව තේරුම් ගත යුතුය.**

මජ්ජිම නිකායේ කන්දරක සූත්‍රය පිළිබඳ අවධානය යොමු කර බැලීමේදී එවකට පැවති විවිධ යෝගී සහ ව්‍රත ක්‍රම බුදුරජාණන් වහන්සේගේ දෘඩි දෝෂදර්ශනයට ලක්විය. තවත් සූත්‍ර ගණනාවකින් එම නෘත, යෝග ක්‍රම දෝෂ දර්ශනයට ලක් කර තිබේ. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබන වකවානුව තුළ නොයෙක් ආගම් හා දර්ශනයන් තුළින් බුදුරජාණන් වහන්සේට බලපෑම් එල්ල විය. එහිදී බුදුරජාණන් වහන්සේ ධර්මයෙන් ඒ සෑම ප්‍රශ්නයකටම තාර්කිකව පිළිතුරු දී එම මිත්‍යා මත කණ්ඩනය කළහ. එහිදී ලෝක නිර්මාණය, කාන්තා නිදහස, ආගමික නිදහස, නිදහස් චින්තනය ආදි කරුණු ගණනාවක් පිළිබඳ විග්‍රහ වන අතර, ඒ සෑම අංශයකින්ම බුදුරජාණන් වහන්සේ නිවැරදි තැන සිටිමින් ප්‍රමුඛස්ථානයට පත්විය. ආර්ය යන වචනයට සැබෑ ලෙසම සුදුස්සෙකු වශයෙන් බුදුරජාණන් වහන්සේ නම් දැරුවේ එබැවිනි. සත්‍ය පසක් කරමින් අලුත් දර්ශනයක් ලෝකයට දේශනා කළ උන්වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවේ සිට එය ව්‍යාප්ත කරන ලදී.

කන්දරක සූත්‍රය තුළින් පුද්ගලයන් සිව්දෙනකු පිළිබඳ කියවේ. එනම්,

01. අත්තන්තප (තමන් තවන පුද්ගලයා)
02. පරන්තප (අනුන් තවන පුද්ගලයා)
03. අත්තන්තප පරන්තප (තමනුත් අනුනුත් තවන පුද්ගලයා)
04. නොව අත්තන්තප නොව පරන්තප (තමනුත් අනුනුත් නොවන පුද්ගලයා)

මෙම දක්වන ලද සත්‍ය ගවේෂකයන් සිව්දෙනාගෙන් මුල් තිදෙනාම එයට ඇතුළත් නොවේ. ඔවුන් සත්‍ය ගවේෂකයන් ලෙස බෞද්ධ දර්ශනය තුළින් ඇගයීමට ලක්කර නැත. නමුත් එවකට සමාජය තුළ ඔවුන් ද එක් අංශයකින් එම කාර්යයේ නියුතු වූ පිරිසකි. එම සිව්දෙනාගෙන් සිව්වැනියා එනම් “නෙව අත්තන්තප නොව පරන්තප” පිළිබඳ බෞද්ධ දර්ශනය තුළ ඇගයීමකට ලක් කොට ඇත. එයට හේතුව වශයෙන් හැඳින්වෙන්නේ එම සූත්‍රය තුළින් මනාව සත්ත්වයින්ටම පොදු වූ කරුණු 02 ක් ඉදිරිපත් කර තිබීමය.

එනම්, "සුඛකාමා දුක්ඛ පටික්කුලා" යන්නයි. සත්ත්වයාගේ සාමාන්‍ය ස්වභාවය සැපට කැමති වීමත් දුක පිළිකුල් කිරීමත්ය. සත්ත්වයන් අතරින් මිනිසා උසස්ම සතකු වශයෙන් ගත් කළ ඔවුන් තුළ මෙම කරුණු දැඩිව පවතී.

මෙම සත්‍ය වූ ධර්මතාවය හඳුනා නොගැනීමෙන් සිදුවන්නේ මානව සම්පත විසින් හෝ මානව සමාජය විසින් ඒවා ප්‍රතික්ෂේප වීමය. එකිනෙකට සාපේක්ෂව ඔවුනොවුන් ජීවන චර්යාව පවත්වා ගනු ඇත. එසේ සමාජයේ ජීවත්වන පුද්ගලයාට වුවද එම සමාජය ගැන කළ කිරීමක් හෝ එපා වීමක් ඇති වූ කළ එයින් නිදහස් වී හුදකලා ජීවිතයක් ගතකිරීමට බුදුදහමින් අවසරය තිබේ. එය සමහර අවස්ථාවලදී බුදුරදුන්ට ද කරන්නට සිදුවිය. ඒ බව ධම්ම පදයේ මෙම පාඨයේද තහවුරු වේ.

**"ඒක චරියං දල්හං කයිරා**
**නත්ථි බාලේ සහායතා"**

ඉහතින් සඳහන් කළ පුද්ගලයින් සිව්දෙනාගෙන් සිවුවැනියා මෙම ක්‍රමය අත්හද බැලීමටත් උත්සහවන්තයෙකි. බුද්ධ චරිතය ගත් කළ ද උන්වහන්සේ බෝධි සත්ත්ව අවදියේදී මෙම සත්‍ය ගවේෂණ විධි ප්‍රායෝගිකව අත්හදා බැලූහ. ම. නි. මහා සීහනාද සූත්‍රය හා මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රය තුළින් සිදුහත් බෝසතාණන් වහන්සේ කරන ලද දුෂ්කර ක්‍රියාව පිළිබඳ සඳහන් වේ. එහිදී ඕනෑම කෙනෙකුට සංවේගයක් හා මහත් දුකක් ඇති වනු නියතය. එයට හේතුව ඒ කරන ලද දුෂ්කර ක්‍රියාව කෙනෙකුට කරන්නට පුළුවන් එකක් නොවන තරම් කටුක වීමය. එසේ වුවද බුද්ධත්වය උදෙසා, ලෝක සත්ත්වයා උදෙසා බෝසතාණන් වහන්සේට එම ආර්ය පර්යේෂණය සිදුකරන්නට සිදුවිය.

බුදු රජාණන් වහන්සේ දේශනා කළ ආකාරයට අනාර්ය පුද්ගලයින් පිළිබඳ දම්සක් පැවතුම් සූත්‍රය තුළින් ද පැහැදිලි වේ. ඒ අනුව අන්තද්වයට පත් වූ පුද්ගලයින් අනාර්ය තත්ත්වයෙහි ලා සැලකිය හැක. එහි සඳහන් පරිදි,

"ද්වෙ මේ භික්ඛ වෙ අන්තා. යො චායං කාමෙසු කාම සුඛල්ලි



කානු යොගො හීනො ගමෙමා, පොථුජ්ජනිකො, අනරියො අනන්ත පද සංහිතො යො චායං අත්ථකිලමතානුයොගො දුක්ඛො අනරියො අතත්ථ පද සංහිතො එතෙ තෙ උභො අනෙතා අනුප ගම්ම මජ්ජිමා පටිපදා තථාගතෙන අභිසම්බුදෙධා චක්ඛු කරණී, ඤාණ කරණී, උපසමාය, අභිඤ්ඤාය, සම්බොධාය නිබ්බානාය සංවත්තති"

මේ ආදී වශයෙන් අත්ථීකිලමතානු යෝගය (ශරීරයට අධික දුක්දීම) කාම සුඛල්ලිකානු යෝගය (ශරීරයට අධික සැපදීම) යන අන්ත දෙකම අනාර්යයන් විසින් පරිහරණය කරන්නක් බව ඉන් පැහැදිලි වේ. එසේ නම් මැදුම් පිළිවෙතින් යුත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ ගොස් නිර්මාණය ක්ෂාත් ක්ෂාත් කරගැනීම උසස් ගුණධර්ම ඇත්තාවුන්ගේ එකම අභිප්‍රාය වේ. ඒ අනුව නිර්වාණය දුටුව උත්තමයන් ආර්යයන් විෂයෙහිලා සැලකිය හැකිය.

අනාර්යය වූ පර්යේෂණ විධි තුළින් දුක් හට ගන්නා අතර, ආර්ය පර්යේෂණ තුළින් සැප හට ගනී. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක පරිදේව ආදී දුක්වලට මුල් වන්නේ අනාර්ය පර්යේෂණයයි. එසේ වුවද ආර්ය පර්යේෂණ තුළින් දුකක්, කණගාටුවක් ඇති නොවේ. එහිදී අධ්‍යාත්මික සුවය ලැබේ. එසේම මෙලොව පරලොව පමණක් නොව සංසාරික භවගමනය වාසනාවන්ත වීමට එය හේතු වේ. එහි උච්චතම අවස්ථාව වශයෙන් නිවන හැඳින්වීමට පුළුවන. "නිබ්බාණං පරමං සුඛං" නිවන උතුම් ම සැපතක් වන්නේ ආර්ය ප්‍රතිපදාවන් ඔස්සේ ගොස් ලබාගන්නා සැපත වෙනස් නොවන බැවිනි. එය සදා කාලීක සැපතකි. බෞද්ධයින් හැටියට අප ප්‍රාර්ථනා කළ යුත්තේ එවැනි සැපතකි. එසේ නම් අනාර්ය පර්යේෂණයෙන් හැකි දුරට ඉවත්වී ආර්ය පර්යේෂණය වර්ධනය කිරීමට උත්සහාවත් වෙමු.



# සිරි දළදා වහන්සේ ලක්දිව වැඩි වග

ආචාර්ය සිරිපාල මාදුවගේ

ශ්‍රී ලංකාවේ පමණක් නොව සමස්ත ලෝකයේ සකල බෞද්ධ ජනතාවගේ අද්විතීය පූජනීය ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ සිංහලද්වීපය කරා වැඩමවීමේ ගමන් මඟ විස්මය ජනක ප්‍රාතිහාර්යජනක වූවකි.

ශ්‍රී සම්බුද්ධ ශරීර ආදාහනයේ දී බුද්ධ අධිෂ්ඨානය පරිදි නොවිසිරුණු සප්ත ධාතූන් අතර සතර දළදාවෝ වෙති. මෙහිදී ඛේම රහතන් වහන්සේ වම් දළදා වහන්සේ රැගෙන කලිඟු රජු හට බණ දෙසීමෙන් සම්දිටු කොට දළදා වහන්සේ පුදන ලෙස භාර කළහ. ගුහාසිව නම් රජ ද කලින් පැහැදීමක් නොමැති ව සිට පසුව දුර්ලබ්ධි හැර පැහැදී දළදා උදෙසා මහත් පූජා කළහ. දුර්ලබ්ධි ගත් පඬුවස් රජ ගුහාසිව රජුගේ ක්‍රියාව ගැන කෝපව සිය බෑණනු චිත්‍රායාන රජ කැඳවා ගුහාසිව රජු හා ඔහු පුදන 'මිනී ඇටය' ගෙන එවයි සිව්රඟ සෙනඟ සමඟ පිටත් කළහ. චිත්‍රයන රජ පඬුවස් රජු හා මිත්‍රව දළදා කෙරෙහි තුටුව නමුදු දඹදිව අගරජ වූ පණ්ඩුවාස රජුගේ වචනය කඩ කළ නොහැකිව චිත්‍ර යාන රජුට සැල කළහ. ගුහාසිව රජ චිත්‍රයාන රජු ඉදිරියේ ප්‍රාතිහාර්ය පාන සේ දළදා වහන්සේට ආරාධනා කළෙන් පෑ මහත් වූ ප්‍රාතිහාර්ය දුටු චිත්‍රයාන රජතුමා තිසරණයෙහි පිහිටා පූජා පැවැත්වීය.

ගුහාසිව රජු මහ පෙරහරින් දළදා වහන්සේ පඬුවස් රජු කරා යැවීය. මහත් කෝපාවිෂ්ඨ පඬුවස් දෙව් රජු දළදාව කිහිරඟුරු වළක ලෑමට ද කිණිහිර පිට තබා තැලීමට ද නියෝග කළ අතර ඒ සෑම අවස්ථාවක දී ම දළදා වහන්සේ මහත් ප්‍රාතිහාර්ය පෑ අයුරු සඳහන් වේ. කිණිහිරි මත රැඳි දළදා මෑත් කළ හැක්කෙක් වේ දැයි රජු නුවර බෙර ලැවීය. සුභද්‍ර නම් සිටුවරයා ඒ පිළිබඳව ඉදිරිපත්ව බෝසතාණන් වහන්සේ සිටි සස, ඡද්දන්ත, ක්ෂාන්තිවාද, ධම්මපාල, මහා කපි, අඵණ්ණක, නිග්‍රෝධමිග, සම්භව, මහාකපි, තුණ්ඩිල, විධුර, වට්ටක, මච්ඡ, වෙස්සන්තර ආදි ජාතකයන් හි දී කළ පින් සිහිපත් කරමින් දළදා වහන්සේ කිණිහිරයෙන් මෑත් කරවීමේ සමත් විය.

අනතුරුව පඬුවස් රජු දළද වහන්සේ පැන් බඳුනකට දැමීම, ඇතුන් ලවා මැඩීම, කුණපයෙන් පිරි අගලකට දැමීම ආදි නොයෙක් අකටයුතු කළ අතර දළද වහන්සේ මහත් ප්‍රාතිහාර්ය පාමින් කාගේත් චිත්ත ප්‍රසාදය ඇති කළහ.

තව දුරටත් මිත්‍යා දෘෂ්ටි නොගෙන සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටන ලෙස අමාත්‍යවරු පඬුවස් රජු හමුවේ ප්‍රකාශ කළෝය. තුටු පහටු රජතුමා දොහොත් මුදුන් තබාගෙන කළ අධිෂ්ඨාන පරිදි දළද වහන්සේ රජුගේ හිස් මුදුනෙහි පිහිටි සේක. අනේකවිධ අයුරින් දළද වහන්සේ පිදූහ. අචල ශ්‍රද්ධාවෙහි පිහිටා සිටි ගුහාසිව රජ අතිවිශ්වාස කොට තමන් හා සමබවට තබා නුවර දෙව් පුරයක් සේ සරහා රාජ්‍යයෙන් පූජා කළේය.

දවස් යනුයේ ක්ෂිරධාර නම් රජුහු "දළදා වහන්සේ දෙව ! නො එසේ නම් යුද්ධ කරව" යි දූතයන් එවූහ. පණ්ඩුවාස රජ "සටන් කියා ආ තගේ මුවින් මහනෙල් මල් පිපේවා" යි පවසන්නේ" දළද වහන්සේ නොදෙමි. යුද්ධ කරමි" යි තොපගේ රජුට කියන්නයි කියා සිටියේය. පණ්ඩුවාස - ක්ෂිරධාර දෙරජුන් අතර යුද්ධය වූ අතර ක්ෂිරධාර රජ තෙමේ පරාජයට පත් විය.

ජයග්‍රාහී පඬුවස් රජ සේනාවට බොහෝ සංග්‍රහ කොට පුතණුවන්ට රාජ්‍ය පවරා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ගුහාසිව රජහට පාවාදී බොහෝ සත්කාර සංග්‍රහ කොට සිය නුවරට යවා බොහෝ වස්තු පරිත්‍යාග කොට පැවිදි බවට පත්විය.

ගුහාසිව රජතුමා පඬුවස් රජු අතින් ලද ශ්‍රී දළදා වහන්සේ තම නුවරට වඩමවා මහත් පූජා පවත්වමින් සිටියහ. මෙකල උදේනි රට උදේනි රජුගේ පුත්‍ර දන්ත කුමරුවෝ කලිඟු රජු සමීපයෙහි ප්‍රසන්නව වසමින් දළදා වහන්සේට අනේක පුද පූජා පවත්වති. ගුහාසිව රජ හේමමාලා නම් තම දියණිය දන්ත යුව රාජ කුමරුන් හට පාවා දී දළදා රැක්ම භාර කළේය. ක්ෂීරධාර රජුගේ බෑණනුවරුන් දෙදෙනෙකු දළදා දෙන ලෙසත්, නො එසේ නම් යුදයට එළඹෙන ලෙසත් පණිවුඩ එවූයෙන් ගුහාසිව රජ දන්ත කුමරු කැඳවා

"කුමර ම දිවි පවත්නා තෙක් අනෙකක් හට අප මුනිඳු දළඳ වහන්සේ නොදෙමි. එහෙත් යුදයෙහි ඔහු දිනන්නට මට නොපිළිවන. තොප දද ලෙසත් ගෙන නොපසිඳු වෙසින් දළදා වහන්සේ වඩාගෙන මෙහි නොසිට ලක්දිව යාකරව" (දළදා සිරිත) යි උපදෙස් දුන්හ.

කළිඟු රාජ නියමය පරිදි හේමමාලා දන්ත කුමරි කුමරුවෝ අනේක දුෂ්කර මධ්‍යයේ දළදා වහන්සේ ලක්දිව වැඩම කළහ. මහාවංශය හා දාඨාවංශය අනුව කිත්සිරිමෙවන් රජුට නව වැන්නෙහි (ක්‍රි. ව. 371) ලක්දිවට වැඩම කරවන ලද දළදා වහන්සේ ඇතුළු නුවර විශේෂ මන්දිරයක තැන්පත් කරන ලදුව මහජන ප්‍රදර්ශනය සඳහා වසරක් පාසා අභයගිරි විහාරයට වැඩම කරන ලදී.

ලංකාවේ රජවරු දළඳ වහන්සේට විශේෂ ගෞරව පුද පූජා කළහ. අබෞද්ධ රජවරු පවා දළඳ වහන්සේ ආරක්ෂා කළහ. දළඳ වහන්සේ හිමි වීම ලක්දිව රජකම ලැබීමේ දී අත්‍යවශ්‍ය වූවක් හෙයින් එසේ කළ බැව් පෙනේ.

මුල සිටම දන්ත ධාතුව අභයගිරි විහාරය හා සම්බන්ධ වූ අතර මහායාන මත ගරු කළ අභයගිරිකයන් අතින් දළඳ වහන්සේ උදෙසා පෙරහැර උත්සව ආමිස පූජා මුල සිට ම ආරම්භ විනැයි පෙනේ.

රාජධානි මාරුවත් ම දළඳ හිමියන් රැකගනු පිණිස රජවරුන්, දළදා මාලිගය සිය රජ මාලිගය අසලම ගොඩ නගා ගත් අයුරු පැහැදිලිය. එපරිදි අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, සීතාවක හා මහනුවර දළඳ මන්දිර ඉදිවූ අයුරු පෙනේ. දළඳ වහන්සේ සිංහල රාජ්‍යත්වයේ උරුමය ලෙස සැළකීම නිසා ඉංග්‍රීසිනට දළඳව නොලැබෙන පිණිස වාරියපොළ සුමංගල අනුනාහිමියෝ දළදා වහන්සේ සඟවාගෙන වනාන්තරගතව මහත් දුක් විඳිමින් ආරක්ෂා කරගත් බව ඉතිහාසය පෙන්වයි. පසුකල ඉංග්‍රීසිනට දළදාව අත් වුවද ආගමික වගකීම් තවත් ඉසිලිය යුතු නැතැයි පවසමින් ඉංග්‍රීසි පාලකයින් විසින් දළදා භාරය යළි සිංලයනට ම පැවරිණි. එපරිදි දළදා වහන්සේ පිළිබඳ භාරකාරත්වය මල්වතු හා අස්ගිරි පාර්ශ්වයන්හි මහානායක හිමිවරුන් ද, දියවඩන නිලමේතුමා ද දරත්.

ඓතිහාසික සෙංකඩගල මහනුවර ශ්‍රී දශ්ට්‍රා ධාතු මන්දිරයෙහි ලෝවැසි බෞද්ධ අබෞද්ධ කාගේත් ගෞරවාදර පුද පූජා ලබමින් ජීවමාන බුදුපියාණන් වහන්සේ ලෙසින් ශ්‍රී දළදා වහන්සේ විරාජමානව වැඩවාසය කරන සේක.



# රාජ්‍ය යහපාලනයට බෞද්ධ උපදේශ

කේ. කේ. එස්. පෙරේරා

අපරාධ මර්දන කාර්යයෙහි දී අතීතයේ සිටි රාජ්‍ය පාලකයන්ද වර්තමානයේදී මෙන්ම දඬුවම් ඇතුළු මර්දනකාරී ක්‍රමෝපයයන් උපයෝගී කරගත් බව පෙනේ. දීඝනිකායගත චක්කවත්ති සීහනාද සූත්‍රය පැහැදිලිව පෙන්වා දෙන්නේ දරිද්‍රතාවය සොරකම් කිරීම, කෲරත්වය, ද්වේෂය, අසත්‍යවාදී බව ආදී අධර්මශීලී ක්‍රියාවන්ට මූලික හේතුව වන බවය. පාලකයන්ගේ ක්‍රමෝපායයන් කොපමණ දුරට ප්‍රතිඵල ශුන්‍ය වූවේද යන්න දීඝ නිකායගත සූත්‍රයක්වන කූටදන්ත සූත්‍රයද පෙන්වා දෙයි.

අපරාධ සම්පූර්ණයෙන් පිටුදැකීම උදෙසා ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය නංවාලියයුතු බව බුදුන්වහන්සේගේ අනුශාසනාවය. මේ සඳහා ජනයාට අවශ්‍ය පරිදි සහනාධාර දියයුතු බව කූට දන්ත සූත්‍රයේ මෙසේ දක්වේ.

ගොවිතැන් කරනුවනට වී බිජුවටද, ගෙරිසරක් රක්නවුනට බත් වැටුප්ද දිය යුතුය. වෙළඳුනට වෙළඳාම වඩනුවට මුදල්ද, රාජකාරියේ යෙදුනවුනට දිනපතා බොජුන්ද මාසික ඈ විසින් වැටුප්ද දෙනු ලැබේවා. මෙසේ කළ පසු ඒ ඒ ජනයෝ තමතමන් අයත් කාරියෙහි නිසි සේ යෙදෙති. ගම් පැහැරුම් නොකරති. මහරජාණන්ගේ ආදයම වැඩෙයි. රටෙහි උවදුරු නැවතෙයි මිනිස්සු තුටු පහටුව දරුවන් ළෙහි පිහිටවන්නාහු සිය ගෙවල් දෙර හැර තැබුවන්සේ කොට සැක බිය නැතිව වසන්නාහ”

බුදුන්වහන්සේ මිනිස් ජීවිතය සමාජ ආර්ථික වාතාවරණයේ සන්දර්භයෙන් බැහැර කොට හුදෙකලා විෂයයක් වශයෙන් නොසැලකූ සේක. උන්වහන්සේ එයින් එපිට සමාජ ආර්ථික හා දේශපාලන අංගයන්ගෙන් සමන්විත පූර්ණ විෂයයක් වශයෙන් සැලකූ සේක. සදාචාර ධර්ම, අධ්‍යාත්මික හා දර්ශනික ගැටලු සම්බන්ධයෙන් උන්වහන්සේගේ දේශනයන්ගේ බොහෝ දුරට ජනතාව අතර ප්‍රචලිතය.

එනමුත් සමාජ, ආර්ථික හා දේශපාලනික කරුණු සම්බන්ධයෙන් උන්වහන්සේ දේශනා පිළිබඳ විශේෂයෙන් බටහිර ජනතාවගේ දැනුම අල්පය. නමුත් මෙම විෂයයන් සම්බන්ධයෙන් බොහෝ කරුණු අන්තර්ගත සූත්‍ර නිකාය ග්‍රන්ථයන් හි සුලභය.



ගිහි මනුෂ්‍යයාට තමාගේ ආර්ථික තත්ත්වය සාර්ථක කරගැනීමේ වැදගත්කම බුදුන්වහන්සේ විසින් සවිස්තරාත්මකව දේශන කොට ඇත. නමුත් බුදුන්වහන්සේ බෞද්ධ ප්‍රතිපදාවේ මූලික හර පද්ධතියට ප්‍රතිපක්ෂව ආසක්තියෙන් හා තෘෂ්ණාවෙන් මඩනා ලදුව සීමා විරහිතව ධනෝපායනයෙහි යෙදීමට මනුෂ්‍යාට අවසර දුන් සේක් යයි අර්ථ නිරූපනයක් නොකළ යුතුය. එමෙන්ම උන්වහන්සේ හැකි සෑම අයුරකින්ම උන්වහන්සේ පනවා වදළ මූලික ප්‍රතිපත්තීන්ට ප්‍රතිපක්ෂවූ ඔවුනොවුන්ට නියුක්ත විය හැකි කවර හෝ වෘත්තියක යෙදී ධනය රැස්කිරීමේ කාර්යයෙහි යෙදීමට මිනිසාට අනුබල දුන් සේක යයි සැලකීමද නොයෙදේ. අවි ආයුධ නිෂ්පාදනය කිරීම අලෙවි කිරීම, මාංශ වෙළඳම ආදී අධාර්මික වෘත්තීන්හි යෙදීම බුදුන්වහන්සේ විසින් ගර්හාවට ලක්කර ඇති බව ප්‍රකට කරුණකි.

**බෞද්ධ ආර්ථික විද්‍යාව**

ගෘහස්ථයට ගැලපෙන ධර්මයක් ඉගෙනීම සඳහා බුදුරදුන්වෙත පැමිණි දීඝජාණු කෝලිය නම් පුද්ගලයෙක් බුදුන්වහන්සේ අමතා මෙසේ පැවසුයේය.

"සමිඳුනි අපි ගිහිව පස්කම් සැප විඳිමු. අඹුදරුවන් මැද වෙසෙමු. කසී සළු, සඳුන්, මල් ගඳ විළවුන් පරිභෝග කරමු. රන් - රිදී - මසු - කහවණු භාවිත කරමු. අප වැනියනට, ගැලපෙන මෙලොවත් පරලොවත් සුව පිණිස පවත්නා දහමක් දේශනා කරන සේක්වා" මේ ආරාධනය පරිදි මේ සංසාරයේ වසන මිනිසාගේ සන්තුෂ්ටියට හේතුවන දහම් සතරක් බුදුන්වහන්සේ දේශනා කළ සේක.

ප්‍රථමකොට - ඔහු කාර්යක්ෂම විය යුතුය. ශක්‍යතා සහිත විය යුතුය. ධෛර්ය සම්පන්න විය යුතුය. තමා නියුක්ත වෘත්තිය පිළිබඳව මනා අවබෝධයකින් යුක්ත විය යුතුය. (උට්ඨාන සම්පදා)

**දෙවැනිව -** ඔහු තමාගේ වෘත්තිය රැකගැනීමට උත්සුක විය යුතුය. එහි නියුක්තව කායිකව වෙහෙසෙමින් එහි සාර්ථකත්වය උදෙසා උත්සුක විය යුතුය. (ආරක්ඛ සම්පදා)

**තෙවනුව -** ඔහු කල්‍යාණ මිත්‍රයන්, එනම් - බහුශ්‍රැත, ගුණවත්, විශ්වාසවන්ත නිදහස් චින්තන සහිත, තමන් යහ මගට යොමුකොට මෙහෙයවන පුද්ගලයන් ඇසුරුකළ යුතුය (කල්‍යාණ මිත්තතා)

**සිව්වැනිව -** ඔහු තමා උපයන ධනය සාධාරණව ඉපයෙන ලාභයට සමානුපාතිකව සම්පත් ප්‍රතිලාභවල සීමාවන් තුළ ජීවිතය හැඩගස්වා ගත යුතුය. (සම ජීවිකතා)

භාරතීය නරපති අශෝක රජතුමා (ක්‍රි. පූ. 3 වැනි සියවස) තමාගේ පුරෝගාමීන් ආදර්ශය අනුව යමින් රාජ්‍ය ශක්තිමත් කිරීමේ අභිප්‍රායයෙන් භාරතයේ ජනපද ආක්‍රමණයේ යෙදිණි. දහ දහස් ගණනින් අහිංසක ජනතාව ඝාතනය කරමින් අසල්වැසි රාජ්‍ය ආක්‍රමණයේ යෙදිණි. නමුත් එතුමා බුදුසමයට අවනතවීමත් සමග බෞද්ධ ප්‍රතිපදාව අනුව ස්වකීය ආකල්ප හා කාර්යාවලිය සම්පූර්ණයෙන් පරිවර්තනයට භාජනය කළේය.

කාංලික දේශය ආක්‍රමණය ගැන සඳහන් වන එතුමාගේ සුප්‍රසිද්ධ ශිලා ලේඛනයෙහි එතුමා ස්වකීය ආක්‍රමණයන් පිළිබඳ අවංකව ශෝකවන බව පවසමින් රාජ්‍ය ආක්‍රමණ ක්‍රියාවලිය හෙළාදකිමින් අවිහිංසාව, ආත්ම දමනය, ශීලවන්ත ජීවිතය ආදි ප්‍රතිපත්තීන් අගය කොට දක්වා ඇත. තමාගේ දරු මුණුබුරන් දේශ ආක්‍රමණයට යොමු නොවේවා යයිද, යුද්ධ මාර්ගයෙන් බැහැරව ධර්ම මාර්ගයට යොමු වේවායිද ප්‍රකාශ කොට ඇත. එම පිළිවෙත මොලොවටත් පරලොවටත් යහපත් වනු ඇත.

**අධික අයබදු හා යහපාලනය පිළිබඳව බුදුන්වහන්සේගේ ඔවදන්**

බුදුන් වහන්සේ දේශපාලනය, යුද්ධය හා සාමය ආදි විෂයයන් පිළිබඳව පැහැදිලි ඔවදන් දේශනා කොට ඇත. බුදුදහම සාමය අගය කරනු බවත් සාමය ප්‍රවර්ධනය කර බවත්, ධර්මයේ මුඛ්‍ය පණිවුඩය වශයෙන් භීෂණය හා ජීවිත විනාශය හෙළා දකින බවත් ප්‍රකට සත්‍යයකි.

බුදු දහම අනුව "ධාර්මික යුද්ධ" නමින් සංග්‍රාම විශේෂයක් නැත්තේය. මෙය භීෂණය හා මනුෂ්‍ය ද්වේෂය කෲරත්වය සාධාරණීකරණය සඳහා නිර්මිත ව්‍යාජ සංකල්පයකි. යුද්ධයක් ධර්මානුකූල බව හෝ අධර්මානුකූල බව - "මගේ යුද්ධය ධර්මානුකූලය - ඔබේ යුද්ධය අධර්මිෂ්ඨය" යි නිගමනය කරන්නේ කව්ද?

බුදුදහම එකහෙලාම මෙම තර්කය ප්‍රතික්ෂේප කරයි. බලතුලනයෙන් හෝ තර්ජන අනුසාරයෙන් සාමය උදකර ගැනීම ආදානශීලීය. බල ප්‍රදර්ශනයෙන් භීතිය විනා සාමය උද්ගත නොවේ. භීතිය ව්‍යාප්ත කොට දීර්ඝකාලීන සාමයක් උදකරගත නොහැකිය. භීතිය, ද්වේෂය ජනිත කරයි. බලය යොදා විරෝධතාවය මැඩපැවැත්වීම හුදෙක් තාවකාලිකය. මේ තත්ත්වය ක්ෂණිකව අවිද්‍යාමාන වී නැවතත් භිෂණය මතුවේ.

සැබෑ නිර්ව්‍යාජ සාමයක් පවත්වාගත හැක්කේ සැකය, භීතිය හා අන්තරායකාරී බව දුරුකොට, මෛත්‍රිය මිත්‍රත්වය වර්ධනය කිරීමෙනි. ස්වකීය දේශයන් අධර්මිෂ්ඨව පාලනය කළ රාජ්‍ය නායකයෝ බුද්ධ කාලයේ පවා විසුහ. ඔවුන්ගේ පාලන තන්ත්‍රයන් යටතේ ප්‍රජාව සුරාකන ලදහ. අධික බදු පැනවීමෙන් හා කෲර දඬුවම්වලට භාජනය කිරීමෙන් අසීමිත පීඩාවට පත්කරන ලදහ.

බුදුන්වහන්සේ රාජ්‍ය පාලකයන්ගේ මෙම ක්‍රියාවන් කෙරෙහි අතිශයින් සංවේදී වූ සේක.

**කාංලික දේශය ආක්‍රමණය ගැන සඳහන් වන එතුමාගේ සුප්‍රසිද්ධ ශිලාලේඛනයෙහි එතුමා ස්වකීය ආක්‍රමණයන් පිළිබඳ අවංකව ශෝකවන බව පවසමින් රාජ්‍ය ආක්‍රමණ ක්‍රියාවලිය හෙළාදකිමින් - අවිහිංසාව ආත්ම දමනය ශීලවන්ත ජීවිතය ආදි ප්‍රතිපත්තීන් අගය කොට දක්වා ඇත. තමාගේ දරු මුණුබුරන් දේශ ආක්‍රමණයට යොමු නොවේවා යයිද, යුද්ධ මාර්ගයෙන් බැහැරව ධර්ම මාර්ගයට යොමු වේවායිද ප්‍රකාශ කොට ඇත.**

උන්වහන්සේ මෙම ක්‍රියාවන් අවලෝකනය කිරීමෙන් යහපාලනය ඇතිකිරීම සඳහා උත්සුක වූ බව ධම්ම පදට්ඨකථා පුවත් අපට පෙන්වා දෙයි.

කිසියම් රාජ්‍යයක නායකයන් අමාත්‍ය මණ්ඩලය හා පරිපාලන නිලධාරී පද්ධතිය දූෂිතව අසාධාරණ වූ අවස්ථාවේදී සමස්ත ජනතාවට වංචනිකව දූෂිතව අතෘප්තිමත් විය හැකි බව බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. කිසියම් රාජ්‍යයක ජනතාව තෘප්තිමත් වීමට එහි රාජ්‍ය පාලකයින් ප්‍රථම කොට ධර්මිෂ්ඨ විය යුතුය. මෙම පරමාර්ථය ඉෂ්ඨ කරගැනීමේ මාර්ගය බුදුරාජණන් වහන්සේ දස රාජ්‍ය ධර්මයෙන් පෙන්වා දී ඇත.

බුද්ධ ධර්මය උත්කෘෂ්ඨ දාර්ශනික සිද්ධාන්තයන් - උදර ගුණධර්මයන් හා දර්ශනික චින්තනයන් සමඟ අන්තර්ගත වූවා විනා පොදුජනතාවගේ සමාජ හා ආර්ථික ප්‍රශ්න කෙරෙහි කිසිදු උනන්දුවක් නොදක්වන බව ඇතැමකුගේ විශ්වාසය වේ. මෙය සාවද්‍ය දෘෂ්ඨිමය ප්‍රකාශයකි. බුදුන් වහන්සේ දුරු ස්ථාවරය අනුව ධාර්මික සදචාර සම්පන්න ප්‍රතිපත්ති මත ගොඩනැගුණු ජීවිතයන් ගතකිරීමෙන් විනා සන්තුෂ්ඨිය උදකරගත නොහැකි බව බුද්ධ දේශනාවය. නමුත් අභිතකර භෞතික හා සමාජමය අවස්ථාවන් හිදී එබඳු ජීවිතයක් ගත කිරීමට බුදුන්වහන්සේ අවබෝධකොට ගෙන සිටි බව පැහැදිලිය.

**බුදුදහම ජීවන මාර්ගයකි.**

බුදුදහම බලය උදෙසා සටන් කිරීම ප්‍රතික්ෂේප කරයි. ජයග්‍රහණය හා පරාජය වීම නිග්‍රහශීලිව සලකයි. අභිසංකයන් වධ බන්ධනයන්ට භාජනය කරවීම නිග්‍රහාත්මකව සලකයි. සංග්‍රාමයේ දී දහස් ගණනක් ජනයා යුද්මය පරාක්‍රමයෙන් පරාජයට පත්කරනුවට වඩා තමා තම ආත්මය ජයගැනීම - ද්වේෂය කරුණා දයාවෙන් පරාජය කිරීම අධර්මය ධර්මයෙන් පරාජය කිරීම උසස් කොට සලකයි. මෙම සත්ක්‍රියාවන් පවත්වා ගැනීමේ බලවේගය වශයෙන් මෛත්‍රිය ප්‍රවර්ධනය කිරීම සෑම ජීවියකුම සැළකිල්ලෙන් ප්‍රේමයෙන් හා සාධාරණත්වයෙන් සැළකීම භෞතික සන්තුෂ්ඨියෙන් සපිරුණු ලොවක සාමය හා සමගිය වර්ධනය කිරීම හා පරමාර්ථය සත්‍යය වන නිර්වාණය අවබෝධ කරගැනීම උදෙසා කරුණාව ජීවමාන ක්‍රියාකාරී බලවේගය වශයෙන් සැළකීම බුදුදහම සියලු කල්හිම ප්‍රවර්ධනය කරයි.

**කුටදත්ත සූත්‍රය - කෘෂිකර්මාන්තය සඳහා අතිරේක සහනාධාර**

කුට දන්ත බමුණා දිනක් බුදුන්වහන්සේ හමුවීමට පැමිණ බිලි පූජාවන්ට අදළ සොළොසක් අවශ්‍යතා සම්පූර්ණ කරමින් බිලි පූජාවක් පවත්වන්නේ කෙසේ දැයි බුදුන් වහන්සේගෙන් විමසූ අවස්ථාවේදී උන්වහන්සේ තමන් වහන්සේගේ පූර්ව ජන්මයන් පිළිබඳ කථා ප්‍රවෘත්තියක් මෙසේ ඉදිරිපත් කළ සේක

"බ්‍රාහ්මණය පූර්වයේදී මහාවිජිත නම් නරපතියෙක් හුදකලාව මෙසේ අතීතය ආවර්ජනය කළේය. මම මිනිස් ලොව පරිමාණයෙන් අප්‍රමාණ ධනස්කන්ධයක් අත්පත්කරගෙන සිටිමි. මා විසින් යටත් කරගන්නා ලද ජනපද විශාල සංඛ්‍යාවක් සන්තකව සිටිමි. අංග සම්පූර්ණ වූ බිලි පූජෝත්සවයක් පැවැත්වුවහොත් එය දීර්ඝ කාලයකට මගේ සන්තුෂ්ඨියට හේතු වනු ඇත."

මෙසේ ආවර්ජන කරමින් පුරෝහිත බමුණා කැඳවා මෙසේ පවසයි.

"මට මහා පරිමාණ බිලි පූජාවක් අංග සම්පූර්ණව පැවැත්වීමේ අභිලාශයක් ඇත. මෙම පූජෝත්සවය සඳකල්හිම මගේ යහපතට හේතුවන්නේ කෙසේද?"



මීට ප්‍රතිචාර වශයෙන් පුරෝහිත බමුණා මෙසේ පවසයි.

"දේවයිනි ඔබේ මේ දනව්ව සොරුන්ගෙන් පෙළුණේය. සොරුන් ගම් නියම්ගම් නුවරවල් පැහැර ඇති නියාව පැණෙයි. මං පැහැර ඇති නියාව පැණෙයි. මෙසෙව් උවදුරු ඇති රටෙකින් අයබදු ගනු නොයෙදෙයි. වද දී සිරගෙහිලා දඩගසා, නිගහා, රටින් නෙරූ හෝ සොර උවදුරු නවතන්නට තැත් කළද වැඩෙක් නොවේ. දඬුවම් ලදවුන්ගෙන් ඉතිරියෝ පසුකලැ රට පෙළති. එබැවින් මෙසේ පිළිපැදිය යුතුය.

ගොවිතැන් කරනවුනට වී බිජුවටද, ගෙරිස රක්නවුනට බත් වැටුප් ද දියැ යුතු. වෙළඳුනට වෙළ දාම වඩනුවට මුදල් ද, රාජකාරියේ යෙදෙනවුනට දිනපතා බොජුන් ද, මාසික ඇ විසින් වැටුප් ද දෙනු ලැබේවා මෙසේ කළ පසු ඒ ඒ ජනයෝ තම තමන් අයත් කාරියෙහි නිසිසේ යෙදෙති. ගම් පැහැරුම් ඈ නොකරති. මහ රජාණන්ගේ ආදයම ද වැඩෙයි. රටෙහි උවදුරු නැවැතෙයි. මිනිසුන් තුටු පහටුවැ දරුවන් ළෙහි නටවන්නාහු සිය ගෙවල් දෙර හැර තැබුවන් සේ කොටැ, සැක බිය නැතීවැ, වසන්නාහ" යනුයි.

මෙම ජාති කථාවස්තුවේ කථානායකයා වූ පුරෝහිත බමුණා වූයේ අනෙකෙකු නොව බෝධිසත්ව අවධියේ තිලෝගුරු බුදුරාජණන් වහන්සේය.

බල පරාක්‍රමය ප්‍රදර්ශනය කිරීමෙන් භීතිය විනා සාමය ජනිත නොවේ භීතිය පතුරුවා සැබෑ දිගු කාලීන සාමයක් උදකරගෙන නොහැකිය. භීතියට ද්වේෂය ජනිත කළ හැක. ජනතා පීඩනයේ ප්‍රතිඵල තාවකාලික ය අවනීතිය නැවත උද්ගත විය හැක. උද්ගත වී භීෂණය දක්වා වර්ධනය විය හැකිය.

බුදුන් වහන්සේ කාමාශාවන්ගේ හීනත්වය අවදනම, හා නෛශ්කාම්‍යයේ සාධනීය ප්‍රතිඵල කුළුගන්වමින් කුටදත්ත අමතා සංශෝධිත අනුශාසනාවක් කළ සේක. මෙම පූර්ව දේශනය හේතුකොටගෙන කුටදත්තගේ මනස තැන්පත් වූ බවත් සුබනම්‍ය වූ බවත්, බාධාවන්ගෙන් විනිර්මුක්ත වූ බවත් ශාන්තව තැන්පත් වූ බවත් දුටු බුදුන් වහන්සේ චතුරාර්ය සත්‍යය අළලා ධර්ම දේශනයක් කළ සේක.

අපිරිසුදු වූ වස්ත්‍රයකින් දුර්වර්ණ ලප කැලැල් ඉවත් කිරීමෙන් පවිත්‍රවන්නේ යම් සේද, එම වස්ත්‍රය වර්ණ ගැන්වීමේදී වර්ණය උරාගන්නේ නම් සේද, කුට දන්තගේ චිත්ත සන්තානයෙහි අක්ලිෂ්ඨ වූත් අකලංකවූත් දහම් ඇස පහළ වීමෙන් අනතුරුව "සම්භවයක් ඇසුරෙන් ජනිත වන සෑම ධර්මයක්ම අවසානය ද ආත්ම කොට පවත්නා බව කුටදත්තට අවබෝධ විය."

*(2016 අප්‍රේල් 21 දින "ඩේලි මිරර්" පත්‍රයේ පළවූ ඉංග්‍රීසි ලිපියක සිංහලානුවාදය)*

# බුදු දහම හා සමාජ ස්ථරායන ගැටලුව

ආචාර්ය කේ.එස්. වර්ණසූරිය



සමාජ ස්ථරායනය ප්‍රාථමික වශයෙන් සමස්ත සමාජ සංවිධානයේ මූලික ප්‍රතිපත්තීන්හි ප්‍රධාන ලක්ෂණයක් වශයෙන් සැළකේ. මෙම සමාජ විභේදනයෙහි විශේෂ ලක්ෂණය වනුයේ එය තුළ අන්තර්ගතවන විවිධ සමාජ ගණවල සාමාජිකයන් ස්වකීය ගණය තුළ සමාන තත්ත්වයන් උසුලමින් සමානතාවයෙන් අන්‍යොන්‍ය වශයෙන් අන්තර් සන්නිවේදන ක්‍රියාවන් හා අන්තර් සම්බන්ධතා පවත්වමින් සමස්ත සමාජය තුළ කුලය, සමාජ ප්‍රභූත්වය, ආර්ථික තලය නොහොත් පංතිය සලකා උසස් පහත් වශයෙන් අනුක්‍රමිකව ශ්‍රේණිගතව ආධිපත්‍ය අනුක්‍රමික ව්‍යුහයක අන්‍යොන්‍ය වශයෙන් ප්‍රභේදනය වී සිටීමය. නමුත් මෙසේ ස්ථිර වශයෙන් වෙන්වී ඇති ගණ අතර සමාජ සංවිධානයේ වෙන්වෙන්ව හඳුනාගත හැකි එක් එක් ගණයට අයත්වන ස්ථානය නිගමනය කිරීම සඳහා පිළිගන්නා ලද හඳුන්වාදිය හැකි විශේෂතා ඇත්තේය. මෙම සමාජ සංවෘත්තිය ධනය, බලය, ශක්තිය, පරම්පරාව. අධ්‍යාපනය හා වෘත්තීය ආදී සාධක මත රඳා පවත්නේය. මෙම ලිපියේදී ජන ව්‍යවහාරයේ "වර්ණ ධර්ම" යනුවෙන් හඳුන්වනු ලබන භාරතීය කුල පද්ධතිය හා එම සමාජ සංසිද්ධියට බුදු දහම දක්වූ ප්‍රතිචාරය පිළිබඳව පැතිකඩ කිහිපයක් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමි.

"වර්ණ ධර්ම" නම් පදය සකස්වී ඇත්තේ "පැහැය" ධ්වනිත කෙරෙන "වර්ණ" ශබ්දය හා "කාර්යය" ප්‍රකාශ කෙරෙන "ධර්ම" ශබ්දය සමග ඒකාබද්ධ වීමෙන් වන අතර වර්ණය පාදක කොටගෙන එම වර්ණය හිමියාට පැවරෙන කාර්ය භාරය එහි අන්තර්ගත අර්ථය වශයෙන් සැළකිය හැකිය. මෙම පාරිභාෂික පදය හින්දු භක්තික සමාජ සංවිධානයෙහි අනන්‍ය සාධාරණ ධ්වනිතාර්ථයක් සමඟ සුවිශේෂතාවයක් පිහිටුවා ඇත.

සමාජ විද්‍යාඥයන්ගේ අර්ථ නිරූපනයට අනුව "වර්ණ ධර්ම" පදයට සමාන ව්‍යවහාරික සංකල්පය වන්නේ "කුලය" ය. මෙම සමාජ සංස්ථාවෙහි සම්භවය ලෝක නිර්මාතෘ "බ්‍රහ්මන්" ගෙන් නිෂ්පන්න වූවකි. ඍග්වේදයෙහි ඇතුළත් ප්‍රකට සූත්‍රයක් වන "පුරුෂ සූක්තය" මෙම සංස්ථාව මේ අයුරින් විග්‍රහ කොට ඇත.

"බ්‍රහ්මණයා ඔහුගේ මුඛය විය (එනම් බ්‍රහ්මණයා බ්‍රහ්මන්ගේ මුඛයෙන් ජනිත විය) ඔහුගේ බාහු යුග්මය රාජන්‍යයා (ක්ෂත්‍රිය වර්ණය) නිර්මාණය කළේය.

වෛශ්‍යයා ඔහුගේ කලවා විය. ශුද්‍රයා ඔහුගේ පාදයන්ගෙන් උපත ලැබීය". ලෝක නිර්මාණ මිත්‍යාව භාරතීය හින්දු සාමයික සම්ප්‍රදය මුළුල්ලේම එකසේ පවත්වාගෙන ඇත. මෙම සංස්ථාවෙහි ප්‍රභවය පිළිබඳ ආරම්භක මතය මහා භාරතය, රාමායනය, ස්වෘති, ධර්ම ශාස්ත්‍ර හා පුරාණයන්හිද එකසේ නොවෙනස්ව අන්තර්ගතව ඇත. හින්දු සමාජ දර්ශනය අනුව බ්‍රහ්මන් සමාජ පංති නිර්මාණය කළා පමණක් නොව වර්ණ චතුෂ්කයට අදළ විවිධ කාර්ය භාරයන්ද පැවරුවේය. මේ අයුරින් සමාජයේ කුල තානාන්තර පද්ධතියේ උච්චතම වර්ණය වූ බ්‍රහ්මණයින්ට වේද මන්ත්‍ර ඉගැන්වීමේ හා පූජකත්ව සම්බන්ධ කාර්යයන් ඉටුකිරීමේ වගකීම පවරන ලදී. ක්ෂත්‍රිය නොහොත් රජකුලයට පවරනලද කාර්යය වූයේ රාජ්‍යය හා රාජ්‍ය පාලනයද, රාජ්‍ය ආරක්ෂාව සඳහා සංග්‍රාම මෙහෙයවීමය. වෛශ්‍යයන්ට කෘෂිකර්මය හා වාණිජ කටයුතු පැවරුනු අතර ශුද්‍රයන්ගේ භූමිකාව බවට නිගමනය වූයේ උසස් කුල ත්‍රිකයේ සාමාජිකයන්ට බැලමෙහෙ කිරීමය.

මෙම සමාජ සංවිධාන ව්‍යුහය තුළ, සමාජ සාධාරණත්වයක මාත්‍රයක්වත් දර්ශනය නොවීම නිසා එම සමාජ ස්ථරායන පද්ධතියත් එය යටතේ සිදුවූ විවිධ පන්තිවලට කාර්ය පැවරීමත් බුදුන් වහන්සේගේ අත්‍යන්ත විවේචනයට භාජනය වූ විෂයයක් විය. හීන යයි සැලකෙන කුලයක ජන්මය ලැබීම මූලික මිනිස් අයිතීන් අහිමිවීමට පවා හේතු විය හැකි බව බුදුන් වහන්සේ නිරීක්ෂණය කළ සේක.

මෙම සමාජ සංස්ථාවේ අසාධාරණත්ව විවේචනයට භාජනය කිරීම සඳහා උන්වහන්සේ තර්ක රාශියක් උපයෝගි කරගෙන ඇත. මෙම අසාධාරණ සමාජ තත්ත්වය උද්ගතවීමට බලපෑ දේව නිර්මාණවාදය උන්වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේදී මේ අයුරින් විවේචනයට භාජනය කොට ඇත්තේය.

"බ්‍රහ්මණයින්ගේ භාර්යාවන් සශ්‍රීකව ගර්භණී වී සිටීම, දරුවන් බිහිකිරීම, දරුවන් මව්කිරෙන් පෝෂණය කිරීම සමාජයේ සුලභ සිද්ධීන් හා දර්ශන වේ. එනමුදු

"බ්‍රාහ්මණ" අභිධානය වෛදික යුගයේ සිට ජනවර්ගයක් හැඳින්වීමේ අර්ථයෙන් භාවිතා වී පැවති නමුත් බුදුන් වහන්සේ එහි මූලික ධ්වනිතාර්ථය ලිහිල්කොට ජන්මය හා සම්බන්ධ නොකර, ජන්මය කෙබඳු වුවද සදචාරවත් උත්තෘෂ්ඨ පුද්ගලයෙකු හඳුන්වන නිර්වචනයක් බවට පත් කළ සේක. මෙම අර්ථකථනය එකල පැවති සමාජ ප්‍රශ්නයට ඉදිරිපත් කරන ලද විශිෂ්ඨ වූ විප්ලවීය ප්‍රවේශයක් විය. මක්නිසාද යත්, මෙම විග්‍රහය අනුව හීන ජන්මයක් ලැබුවෙකු පවා ජීවන චර්යාවෙන් පරිශුද්ධ වූයේ නම් බ්‍රාහ්මණ අභිධානයට සුදුස්සකු වන හෙයිනි.

මව්කුසින් මෙලොවට බිහිවූ මෙම බමුණෝ තමන් බ්‍රහ්මයාගේ මුඛයෙන් බිහි වූ බව පවසති" (දීඝනිකාය)

බුදුන් වහන්සේ මානවයන්ගේ ජීවවිද්‍යානුකූල සම්භවය පිළිගෙන තිබූ බව මෙම ප්‍රකාශයෙන් මනාව ස්ඵුට වේ. අදේවවාදී ආගම් දර්ශනයක් වූ බුදුදහම බමුණු ගුරුන් විසින් හුවාදක්වා තිබූ දේව නිර්මාණ වාදය එකහෙළ, බැහැර කරයි. සමාජ සංස්ථාව ශ්‍රම විභජනය පදනම් කොටගත් ස්ථරායනයකට භාජනය වී පවත්නා ක්‍රියාවලිය හේතුකොටගෙන හටගෙන ඇති බවත් එම මානව නිර්මාණයක් බුදු දහම එකහෙළා ප්‍රකාශ කරයි.

වර්ණ ධර්මය යනුවෙන් හැඳින්වෙන භාරතීය කුල ක්‍රමය පුද්ගලයකුගේ කුලය ඔහුගේ ජන්මය අනුව අනිවාර්ය අයුරින් නියමිත සමාජ ගණයකට ඇතුළත් කරන අනම්‍යශීලී සමාජ සංස්ථාවකි. මේ අනුව සෑම පුද්ගලයකුගේම අනන්‍යතාවය හා සමාජයේ ස්ථානගතකිරීම සමාජයීය හා නෛතික වශයෙන් මෙන්ම ආගමික වශයෙන්ද අපරිවර්තනීය අයුරින් ස්ථාපිත වී අවසන්ය. මෙම තත්ත්වය එකී සමාජ සංස්ථාවේ පුමුඛවූත් අවියෝජනීය වූත් ලක්ෂණයන්ගෙන් එකක් වේ. බුදුන් වහන්සේ මෙම අනම්‍ය සමාජ සංස්ථාව දැඩි සේ විවේචනය කොට ඇති අතර පුද්ගලයකුට සමාජයේ හිමිවන ස්ථානයෙහි හා අනන්‍යතාවයෙහි පරිවර්තනීයත්වය අවධාරණය කොට ඇත. කිසියම් පුද්ගලයෙකු බ්‍රහ්මණයකු හෝ වසලයකු වන්නේ ඔහු කිසියම් ගණයක සාමාජිකයකු වශයෙන් ලබන උත්පත්තිය පාදක කොටගෙන නොවන බව බුදුන්වහන්සේ විවිධ දේශනාවන්හිදී පැහැදිලිව පවසා ඇත.

හැඩපළු ගෙතුණු කේශකලාපය, පරම්පරාව හා ජන්මය අනුව පුද්ගලයකු බ්‍රාහ්මණයකු නොවන බව බුදුන් වහන්සේ වදරා ඇත. මීට වෛකල්පිත වශයෙන් පුද්ගයකුගේ සමාජ අනන්‍යතාවය හා තත්ත්වය නිගමනය කෙරෙන සාධක වන්නේ ඔහුගේ චෛතසික හා භෞතික චර්යාව බව උන්වහන්සේ අවධාරණය කොට ඇත. මෙම සාධකයේ ස්වභාවය අතිශයින්ම වැදගත් වන්නේය. එය සුඛනම්‍ය හා පරිවර්තනීය වන අතර කිසිදු පුද්ගලයෙකු නියමිත චර්යා රටාවකට ආවේනිකව උපත ලබන්නකු නොවන්නේය. බුදු දහම අනුව කිසිදු අපරිවර්තනීය, ඒකාන්තික සමාජ පන්ති කුල (වර්ණ) හෝ ජනවර්ග ලොව නොපවතී. මෙම තත්ත්වය අනිත්‍ය ධර්මය සමග සාකල්‍යයෙන්ම අනුකූලය.

"බ්‍රාහ්මණ" අභිධානය වෛදික යුගයේ සිට ජනවර්ගයක් හැඳින්වීමේ අර්ථයෙන් භාවිත වී පැවති නමුත් බුදුන් වහන්සේ එහි මූලික ධ්වනිතාර්ථය ලිහිල්කොට ජන්මය හා සම්බන්ධ නොකර, ජන්මය කෙබඳු වුවද සදචාරවත් උත්තෘෂ්ඨ පුද්ගලයකු හඳුන්වන නිර්වචනයක් බවට පත් කළ සේක. මෙම අර්ථකථනය එකල පැවති සමාජ ප්‍රශ්නයට ඉදිරිපත් කරන ලද විශිෂ්ඨ වූ විප්ලවීය ප්‍රවේශයක් විය.



මක්නිසාද යත්, මෙම විග්‍රහය අනුව හීන ජන්මයක් ලැබූවකු පවා ජීවන චර්යාවෙන් පරිශුද්ධ වූයේ නම් බ්‍රාහ්මණ අභිධානයට සුදුස්සකු වන හෙයිනි. සමාජ සාමයික ප්‍රතිසංස්කාරකයකු වශයෙන් බුදුන්වහන්සේ මේ අයුරින් වර්ණය පාදක කොටගත් සමාජ සංස්ථාව දැඩි සේ නිග්‍රහයට භාජනය කොට ඇත.

සමාජ පන්තිය හා කුලය හැඳින්වෙන වර්ණ සංකල්පය පිළිබඳ විද්‍යානුකූල විශ්ලේෂණයක් අන්තර්ගතවන වාසෙට්ඨ සූත්‍රය නම් වැදගත් සූත්‍රයක් ඛුද්දක නිකායික ග්‍රන්ථයක් වන සුත්ත නිපාතයේ ඇතුළත් කොට ඇත. මෙම සූත්‍රයේදී භාවිත ඇතැම් තර්කයන් ජීව වර්ගීකරණ විද්‍යාවට අනුගත ජීව විද්‍යාත්මක සිද්ධාන්ත පදනම් කරගෙන ඇති අතර සමහරක් ආචාර විද්‍යාත්මක හා ආර්ථික විද්‍යාමය න්‍යාය ධර්මයක් මත ගොඩනැගී ඇති ඒවාය. පළමුවැනි තර්කය ශාකවල ලක්ෂණයක් පදනම් කරගන්නා ලද්දකි.

දන්නහුය ඔබ - ගස් හා
තණකොළ ගැන
ඒවා කිසිදිනක - තමා
ගැනම නොපවසයි
උපතින් ලද දෙයකි - ඒ
ඒ ගසෙහි හැඩරුව
වෙනස් වේමය -
ජාතිවශයෙන් (සු.නි. 604)

මෙම තර්කය පැහැදිලි කිරීමේදී බුදුන් වහන්සේ ප්‍රථම කොට තෘණ ශාකයෙහි හා වෘක්ෂයන්හි සහජ ලක්ෂණ සැලකිල්ලට භාජනය කරන සේක. තෘණ ශාකය වෘක්ෂයෙන් වෙනස් වේ. මේ වෙනස හටගන්නේ සහජ ලක්ෂණයන් අනුවය. ගසෙහි අරටුවක් ඇතත් තෘණ ශාකයෙහි අරටුවක් නැත. මෙම විෂමතාවයට හේතුව තෘණ ශාකයත් වෘක්ෂයත් අන්‍යොන්‍ය වශයෙන් අසමාන ශාක වර්ග විසින් ප්‍රජනනය කොට තිබීමය.

බුදුන් වහන්සේ අනතුරුව කෘමීන්, උරගයින්, මත්ස්‍යයන් හා පක්ෂීන් විමංශනයට භාජනය කරන සේක. ශාක විශේෂයන් මෙන්ම මෙම ජීවියෝද අන්‍යොන්‍ය වශයෙන් විසම සත්ත්ව වර්ග විසින් ප්‍රජනනය කරන ලද්දෝ වෙති. මේ හේතුකොටගෙන මොවුහු සහජ සුවිශේෂී ව්‍යුහාත්මක විෂමතාවයන්ගෙන් යුක්ත වූවෝ වෙති.

මිනිසා විසින්ම නිර්මාණය කරගන්නා ලද විවිධ ප්‍රභේදනයන් සහිත මනුෂ්‍ය ප්‍රජාව විග්‍රහකොට දැක්වීම සඳහා බුදුන් වහන්සේ පූර්වෝක්ත විශ්වීය ජීව විද්‍යාත්මක සිද්ධාන්තය උපයෝගී කරගෙන ඇති බැව් පෙනේ. මෙම සත්‍යය වාසෙට්ඨ සූත්‍රයේදී මේ අයුරින් ප්‍රකාශ වී ඇත.

## පණ්ඩිත වග්ගෝ ජටෙඨෝ

ගාථාව

**ඕවදෙය්‍යනුසාසෙය්‍ය,**
**අසබ්භා ච නිවාරයේ,**
**සතං හි සෝ පියෝ හෝති,**
**අසතං හෝති අප්පියෝ.**

තේරුම

**පණ්ඩිතයා අනුන්ට අවවාද කළ යුතුය, අනුශාසනා කළ යුතුය. අනුන් අසභ්‍ය දෙයින්, අකුසලයෙන්-වැළැක්විය යුතුය. එසේ කරන්නා සත්පුරුෂයන්ට ප්‍රිය වේ. අසත්පුරුෂයන්ට අප්‍රිය වේ.**

"මේ ජාතීන් හට - උපතින්ම පිහිටා ඇති
සළකුණුද ඇත බොහෝ
එහෙත් මිනිසුන් අතර
උපතින්ම පිහිටා ඇති සලකුණු
නොමැත"

(සු.නි. 610)

බුදුන් වහන්සේ මෙම විශ්වීය සත්‍යය පිළිබඳවත්, මානව වර්ගයාගේ ජීව විද්‍යාත්මක ඒකීය භාවය පිළිබඳවත් මනා අවබෝධයකින් සිටි බැව් පෙනේ. මෙම සත්‍යය තවදුරටත් පැහැදිලි කිරීම් වස් උන්වහන්සේ මෙසේ වදාරන සේක.

"අනෙක් සත්ත්ව වර්ගයාගේ මෙන් නොව මිනිසුන් අතර ඇස් කන්, නාසය, මුඛය, තොල්, ඇහිබැම, ග්‍රීවය, උරහිස්, උදරය, පිට, ඉණ, උරිය, අත් පා, නිය, කොණ්ඩා, කලව ආදී කායික අවයවයන්හි මෙන් ලිංග චර්යාවන්ගේද කටහඬෙහිද වෙනසක් නොමැත. මිනිසුන් වෙනස් වන්නේ පුද්ගලනාම ව්‍යවහාරයෙන් පමණි. මෙයද අහේතුකය."

මෙම වාසෙට්ඨ සූත්‍රය මානව වර්ගයාගේ ඒකීයත්වය අවධාරනය කරයි. බෞද්ධ සමාජ දර්ශනය අනුව මානවයා එකම ජීව වර්ගයකින් නිෂ්පන්නය. මිනිසුන් අතර ජීව වර්ණය, කේෂවර්ණය ආදී ලක්ෂණ නාම මාත්‍රමය පමණක් වන අතර අනෙක් සත්ත්ව වර්ගයා මෙන් ඒකාන්තික නොවේ. තවද මෙම විසමතා පාරම්පරික හෝ භූගෝලීය හේතූන් මත සිදුවී ඇත.

බුදුන් වහන්සේ මේ අයුරින් වාර්ගික හා කුල ප්‍රභේදයන් විවේචනය කොට සමාජ අසමානත්වයට හේතුපාදක වන ආර්ථික හා ආචාර ධර්මයමය හේතූන් කෙරෙහි යොමුවන සේක. බොහෝ සමාජයන්හි පුද්ගලයන් සමාජයේ උසුලන අනන්‍යතාවය හා තත්ත්වය ඔවුන්ගේ වෘත්තීන් හෝ ජීවන ක්‍රියාවලීන් අනුව නිගමනය වන ලක්ෂණය. මෙය ඓතිහාසික හා අනුභූතික සත්කාවකි. මෙම සංසිද්ධිය නිරවශේෂයෙන් අවබෝධ කොටගත් බුදුන් වහන්සේ එය වර්ණ ධර්මයෙහි දෘඪත්වය හා අනම්‍යතාවය තදබල අයුරින් විවේචනය කිරීමට උපයෝගී කොටගත් සේක.

ගොවිතැන් කරන්නෝ ගොවියෝ වෙති. ශිල්ප ප්‍රගුණ කරන්නන් ශිල්පීන් වන අතර වෙළඳාමෙහි යෙදෙන්නෝ වෙළෙන්දෝ වෙති. බැලමෙහෙ කරන්නන් දසයන් වන බවත් සොරකම් කරන්නන් චෞරයන් වන බවත් යුද අවිහාවිතා කරන්නන් යුද්ධ ශිල්පීන් වන බවත් රාජ්‍ය උපදේශනයෙහි යෙදෙන්නන් පුරෝහිතයන් වන බවත් බුදුන් වහන්සේ වදරා ඇත. මේ කිසිවෙක් බමුණෝ නොවෙති. බැමිණියක කුසින් උපන් පමණින් අයෙකු බමුණෙක් නොවේ"

මේ ප්‍රකාශයෙන් ස්ඵුට වන්නේ පුද්ගලයකුගේ සමාජ අනන්‍යතාවය හා සමාජයේ ස්ථානගතවීම නිගමනය වන්නේ ඔහුගේ වෘත්තීය හා ජීවන කාර්යය මත බවය.

මේ අතරම විශේෂයෙන් සැලකිය යුත්තේ මෙම ලක්‍ෂණයන්ද, අපරිවර්තනීය හෝ ඒකාන්තික නොවන අතර ජීවන චර්යාව හෝ වෘත්තීය වෙනස් වීමත් සමග එම ලක්ෂණයන්ද අනුරූපීව වෙනස් විය හැකි බවය.

තවද, බුද්ධ කාලයේදී ස්වකීය පූජක කාර්ය ආශ්‍රිත හා අධ්‍යාපනික කාර්යයන්ට අතිරේකව කෘෂිකර්මය පශු පාලනය, වෙළඳාම, ජ්‍යොතිෂය ආදී ජීවන වෘත්තීන්හි යෙදුනු බමුණන්ද සිටි බව සැළකිය යුතුය. බුදුන් වහන්සේට නියත වශයෙන්ම අවධාරණය කිරීමට අවශ්‍ය වූයේ මෙම ජීවිකා වෘත්තීන්හි නියුක්ත වූවන් බමුණු කුලයේ ජන්මය ලැබූවන් වූ නමුත් සත්‍ය වශයෙන් බ්‍රාහ්මණයන් නොවන බවය.

කිසියම් පුද්ගලයකු උපතින් එනම් බමුණු පවුලක උපන් පමණින් නියම අර්ථයෙන් "බ්‍රාහ්මණයකු" වන්නේය යන සිද්ධාන්තය අඥාන පුද්ගලයින් විසින් පවත්වාගෙන එනු ලබන ආදිකල්පික අකර්මණ්‍ය මතයක් බව බුදුන් වහන්සේ අවධාරණය කර ඇත.





